ක්‍රිස්තුස් වහන්සේගේ

පෙර මඟ දූතයා

ශුද්ධ බයිබලය

" ධර්මිෂ්ඨකමට සාපිපාසා ඇත්තෝ ආශීර්වාද ලද්දෝය. මක්නිසාද, ඔවුහු තෘප්තියට පැමිණෙන්නෝය." (මතෙව් 5 : 6)

75 වන වෙළුම අංක 09 (897) 2016 සැප්තැම්බර්

නිරාහාර යාච්ඤා කිරීමෙහි රැඳී සිටින්න.

ඩබ්.සී මෝරේ විසිනි

අපගේ දවස්වලදී කිතුණු සෙනඟ අතරේ ශුද්ධාත්මයාණන් වහන්සේගේ සැබෑ පිබිදීම නැවත දැකීම අඩුවෙමින් පවතින බව දැකිය හැකිවේ. නමුත් ප්‍රේතුස් ශුද්ධාත්මයෙන් පූර්ණව යෝවෙල් අනාගතවකතෘ තුළින් ප්‍රකාශ කළ අනාගතවාක්‍යය සභාකාලය තුළදී ඉටුවන බව අපට පෙන්වා දෙනු ලබයි. (ක්‍රියා 2:14-21 දක්වා කියවන්න) පෙන්තකොස්ත දවසේ පටන් සභා කාලය ආරම්භවී අද දවස දක්වාත් නොකඩවා පවතින්නේය. දෙවියන් වහන්සේ මෙසේ පොරොන්දු වූ සේක. **"අන්තිම දවස්වල දී මාගේ ආත්මය සියළු මනුෂ්‍යයන් පිට වගුරුවන්නෙමි."** (ක්‍රියා 2:17)

දෙවියන් වහන්සේ අපව උන්වහන්සේගේ ආත්මයෙන් පූර්ණකර තිබෙන නිසා අපි අධෛර්‍යය නොවී ඒ පිළිබඳව ඉතා ගෞරවයෙන් සැලකිය යුතුය. පිබිදීම අවශ්‍ය බව අපි අවබෝධ කරගැනීම දෙවියන් වහන්සේට උවමානාවී තිබෙන සේක. ඒ උදෙසා උන්වහන්සේ බලාපොරොත්තු වන සුදුසුකම් අපි සම්පූර්ණ කරනවිට පැමිණේ පිබිදීම උදෙසා අපි දණින් වැටී යාච්ඤා කළ යුතුය. යෝවෙල් අනාගත වකතෘගේ කාලයේ දී ප්‍රීතියත්, මහත් හඬින් මොර ගැසීමද නිසා සෙනඟ ගෞරවාන්විත තත්වයට පැමිණියෝය. (යෝවෙල් 2:12-27)

දෙවියන් වහන්සේ විශ්වාසවන්තව සිටින සේක. අපි අපගේ ජීවිත යටහත් කරගෙන යාච්ඤා කරමින්, උන්වහන්සේගේ මුහුණ සොයමින් අපගේ නපුරු මාර්ග අත්හරින විට උන්වහන්සේ ස්වර්ගයේ සිට අසා පිළිතුරු ලබාදෙන සේක. (2 ලේකම් 7:14) මේ දවස්වලදීත් එය එසේම වන්නේය. **"මක්නිසාද, දෙවියන් වහන්සේගෙන් වූ කිසි වචනයක් බලරහිත නොවන්නේ යැයි කීවේය."** (ලූක් 1:37)

අද දවසේ කිතුණුවන් අතරේ පාපය අසාමාන්‍ය ලෙස (අප්‍රසන්න ලෙස) ප්‍රකාශ වෙනවා සහ අපරාධ බහුල ලෙස ජය ගනිමින් පවතිනවා පෙනෙන්නේය. එය යුදෙව්වන් ස්වාමීවූ යේසුස් වහන්සේව ප්‍රතික්ෂේප කර, දෙවියන් වහන්සේගේ පුත්‍රයාණන්ව කුරුසපත් කිරීම අපට මතක් කර දෙන්නේය. එසේ වුවත් යුදෙව්වන්ගෙන් කුඩා කණ්ඩායමක් එක්රැස්වී යාච්ඤා කිරීම තුළ පෙන්තකොස්ත දවසේදී ආරම්භ වූ බලවත් පිබිදීම එතැනින් පසු උන්වහන්සේ ඔසවා ගන්නාවූ දවස දක්වා විවිධ වර්ෂවලදී (අවස්ථාවලදී) නොකඩවා ඔවුන් අතරට එවමින් තිබෙන සේක. එම නිසා මෙම අවසාන දවස්වලදීත් උන්වහන්සේ පිබිදීම එවීමට බලා සිටින සේක. දෙවියන් වහන්සේගේ අභිමුඛත්වයේ රැඳී සිටීමේ අත්දැකීම නැවුම්ව තිබීම තුළ මුනුෂ්‍යයන් ගැලවීමට පැමිණෙන්නෝය. එමෙන්ම නුවණැති කන්‍යාවියෝ ස්වර්ගීය මනමාලයා වන යේසුස් වහන්සේගේ පැමිණීමට සූදානම්ව සිටින්නෝය.

යොහාන් බෞතීස්ත මෙන් කෙනෙක් වන්න

ඊශ්‍රායෙල්ගේ වේදනාත්මක පිරිහීයාමේ කාලය තුළ දී දෙවියන් වහන්සේ යෙසායා අනාගතවකතෘ තුලින් පවසා තිබූ පරිදි මාර්ගය පිළියෙල කිරීමට යොහාන් බෞතීස්තව එවූ සේක. **"ඒ දවස්වලදී යොහාන් බෞතීස්ත ඇවින් යුදයේ වනයෙහි දේශනා කරමින් පසුතැවිලි වෙයල්ලා මක්නිසාද, ස්වර්ග රාජ්‍යය ළඟයයි කීවේය. කුමක් හෙයින් ද, ස්වාමීන් වහන්සේගේ මාර්ගය පිළියෙල කර උන්වහන්සේගේ මාවත් සමතලා කරපල්ලාය කියා වනාන්තරයෙහි හඬගසන්නෙකුගේ ශබ්දයයි අනාගතවකතෘ වූ යෙසායා කරුණුකොටගෙන කියන ලද්දේ, මොහු ගැනය."** (මතෙව් 3 :1-3) (යෙසයා 40:3-5) දක්වාත් කියවන්න.) යොහාන් බෞතීස්ත යේසුස් වහන්සේට පෙරටුව ගියාවූ එක් මනුෂ්‍යයෙක් විය. සභාව තුළ බොහෝ සාමාජිකයන් සිටියත් එක් ශරීරයකි. සභාවේ සිටින්නාවූ බැතිමතුන් තුලින් දෙවියන් වහන්සේ ක්‍රියා කරන සේක. එහිදී යේසුස් වහන්සේගේ දෙවෙනි පැමිණීම උදෙසා මාර්ගය පිළියෙල කරන්නාවූ කැපී පෙනෙන යම් එක් අනාගතවකතෘ කෙනෙක් පිළිඳව ප්‍රසිද්ධියට පත්කර නොමැත. නමුත් ඉතිරිවී සිටින්නාවූ අයව දෙවියන් වහන්සේ පුබුදුවාලමින් ශුද්ධාත්මයාණන් වහන්සේගේ බලය කරුණු කොටගෙන පිබිදීම ප්‍රකාශ කිරීමට හොරණෑවක් මෙන් පාවිච්චි කරන සේක. (යෝවෙල් 2:1) එමේන්ම ස්වාමීන් වහන්සේගේ දෙවෙනි පැමිණීම උදෙසා පිපාසයෙන් යටහත්ව සහ සූදානමින් සිටින්නාවූ කිතුණුවන්ට පිළියෙල කරන ලද සහ දැල්වෙන්නාවූ පහන් බවටත් පත් කරමින් ශුද්ධාත්මයෙන් පූර්ණ කරන සේක.

ප්‍රකාශකර තිබෙන්නාවූ අනාගතවාක්‍යය පරිදි යොහාන් බෞතීස්ත පැමිණියේය. (මතවේ 3:3) නමුත් එම අනාගත වාක්‍යය සම්පූර්ණවීම සඳහාත් යාච්ඤා කිරීම අවශ්‍යව තිබුණේය. එලෙස යාච්ඤා කිරීමට පිළිතුරු වශයෙන් දේවදූතයා සෙකරියස් ඉදිරියේ කෙලින්ම පෙනී සිටියේය. **"නුමුත් දේවදූතයා ඔහුට කථාකොට, සෙකරියස් භය නොවන්න. මක්නිසාද, නුඹේ කන්නලව්ව අසන ලද්දේය. නුඹේ භාර්‍යාව වූ එළිසබෙත් නුඹ නිසා පුත්‍රයෙකු වඳන්නීය. ඔහුට යොහාන් යන නම තබාපන්න. "** (ලූක් 1:13) එම නිසා පිබිදීම පැමිණීම උදෙසා යාච්ඤා කිරීම අත්‍යවශ්‍යය වන්නේය. පිබිදීම පැමිණෙන්නේ යාච්ඤා කිරීමට පිළිතුරු වශයෙන් බව යෝවෙල් අනාගතවකතෘ ද පවසා ඇත. (යෝවෙල් 2:12-17, 2:18-29 සහ ලූක් 18:1-8 දක්වාත් කියවන්න.) **"ස්වාමී වූ දෙවියන් වහන්සේ මෙසේ කියන සේක. මෙය ඊශ්‍රායෙල් වංශයට කරන ලෙස මම ඔවුන්ගේ ඉල්ලීමට තවදුරටත් ඇහුම්කන් දෙන්නෙමි. රැළක් මෙන් ඔවුන්ගේ ගණන වැඩි කරන්නෙමි."** (එසකියෙල් 36:37) ස්වාමීන් වහන්සේ මෙලෙසින් ද පවසා තිබෙන සේක.

"ඉල්ලාපල්ලා එවිට නුඹලාට දෙනු ලැබේ. සොයාපල්ලා එවිට නුඹළාට සම්බවේ. තට්ටු කරපල්ලා එවිට නුඹලාට දොරහරිනු ලැබේ." (මතෙව් 7:7)

එළිසබෙත් වඳව සිටිද්දීත්, සෙකරියස් සහ එළිසබෙත් යන දෙදෙනාම වයස්ගතව සිටිද්දී දරුවෙක් උපදින්නට නොහැකිව තිබුණා වූ වාතාවරණයක් තුළ දී යොහාන් බෞතීස්ත උපත ලැබුවේය. (ලූක් 1:5-7) එම ස්වභාවයෙන්ම පවතින්නාවූ මෙම අවසාන කාලයේදීත් කාන්තාරයෙහි මාවතක් සාදන්නාවූ ස්වාමීන් වහන්සේගේ පිබිදීම අපි බලා සිටිමු. (යෙසායා 40:3, 43:19) එවිට සිදු විය නොහැකි යැයි හැගෙන්නාවූ කාරණාවන් ඉටුවන බව අපි දකින්නෙමු.

කාන්තාර වැනි තත්ත්වයන්ගෙන් බොහෝ සභාවන් වර්තමානයේ දී ජයගෙන තිබීම එක් ලක්ෂණයකි. නමුත් එය සභාවේ අවසාන තත්ත්වය නොවේ. එබැවින් පිබිදීමක් ස්වර්ගයෙන් පැමිණිය යුතුය. **"බලව මම අලුතු දෙයක් කරන්නෙමි. දැන් ඒක හටගන්නවා ඇත. නුඹලා ඒක නොදන්නහුද, ..? මම කාන්තාරයෙහි පවා මාර්ගයක් ද, වනයෙහි ගංගා ද, සාදන්නෙමි."** (යෙසායා 43:19) **"මක්නිසාද, පිපාසා ඇත්තා කෙරෙහි වතුරද, වියළි භූමිය කෙරෙහි ජලධාරා ද, වගුරුවන්නෙමි. නුඹේ වංශය කෙරෙහි මාගේ ආත්මය ද, නුඹේ දරුවන් කෙරෙහි මාගේ ආශීර්වාදය ද, වගුරුවන්නෙමි.** (යෙසයා 44:3) දෙවියන්වහන්සේ ප්‍රකාශ කර තිබෙන මෙම අනාගතවාක්‍යවලින් අපි කිසිසේත් ඉවත්ව නොයා යුතුය.

යොහාන් බෞතීස්ත පිළිඳව දේවදූතයා සොකරියස්ට මෙලෙස පැවසූ සේක. **"ඔහු පියවරුන්ගේ සිත් දරුවන් දෙසටත්, අකීකරුවන් ධර්මිෂ්ඨයන්ගේ ඥානයෙහි හැසිරීමටත් හරවන පිණිසද, සූදානම්වූ සෙනඟක් ස්වාමීන් වහන්සේට පිළියෙල කරන පිණිසද, එළියාගේ ආත්මයෙන්ද, බලයෙන්ද, උන්වහන්සේට පෙරටුව යන්නේ යයි කීවේය."** (ලූක් 1:17) යේසුස් වහන්සේගේ දෙවන පැමිණීමට පෙර මේ අන්තිම කාලයේ දී ඉතිරිව සිටින්නාවූ අය තුලින් දෙවියන් වහන්සේගේ පිඹීදීමේ කාර්‍යය ඉටුකරන සේක. මනුෂ්‍යයන් දෙවියන් වහන්සේ වෙතට නැවත හැරීඒම සහ ස්වාමීන් වහන්සේගේ නැවත පැමිණීම උදෙසා සූදානමින් ස්තීරව පැවතිය යුතුය.

පිපාසිත අයව දෙවියන් වහන්සේ කැඳවන සේක

වර්තමානයේ දී දෙවියන් වහන්සේ උදෙසා බොහෝ දෙනා පිපාසිතව

2 පිටුවට

"මධ්‍යම රාත්‍රියේ අන්න මනමාලයා එනවා ඔහුගේ පෙරමඟට වරෙල්ලායයි හඬක් වූයේය. " (මතෙව් 25:6)

1 පිටුවෙන්

නිරාහාර යාච්ඤා කිරීමෙහි

සිටින අතර දෙවියන් වහන්සේ ඔවුන් අතරේ යම් අය ගැන කණගාටුවන සේක.මක්නිසාද දෙවියන් වහන්සේගේ සෙනඟ බයාදුකම තුළ රැඳී සිටින්නෝය. ස්වාමීන් වහන්සේගේ දෙවෙනි පැමිණීම උදෙසා මාර්ගය පිළියෙල කිරීමට සෙනඟ අතරට යාමට පෙර ශුද්ධාත්මයාණන් වහන්සේගේ බලයෙන් පූර්ණවීමට කැඳවා තිබෙන්නේ එම නිසාය. අපි දෙවියන් වහන්සේගේ වචනයේ ප්‍රකාශකර තිබෙන පණිවිඩය විශ්වාස කරවා වුවත් අපගේ ඇදහිල්ල සෝදිසි කරන සේක. (ලූක් 18 : 7-8)

පිඹීදීම උදෙසා යාච්ඤා කරන්නාවූ අයව ධෛර්‍යමත් කරන්නෙමු. මේ නපුරු දවස්වලදී කිතුණුවන් අතරේ යාච්ඤා නොකර සිටින අය ගැන, ප්‍රේමය නැතිව සිටින අය, ඕපාදූප කථාකරන්නන්, නොවැදගත්දේ කරන අය, නිරර්ථක දේවල යෙදෙන්නන්, ලෞකිකව සිටින්නන්, අලසව සිටින අය ගැන අපි සැලකිලිමත්කම ප්‍රකාශ කරනවා දැකීම දෙවියන් වහන්සේට අවශ්‍යව තිබෙන සේක. දෙවියන් වහන්සේගේ සෙනඟගේ පීඩාව ගැන දුක්වන්නාවූ අය ගැන දෙවියන් වහන්සේ බලා සිටින සේක. එසේ නොවන්නා වූ අයට දුක්වේ.

"තූර්‍යභාණ්ඩ උපද්‍රවා ගන්නාවූ, මුද්‍රිකපාන පාත්‍රවලින් බොන්නාවූ, ඉතා හොඳ තෙල් ආලේප කරන්නාවූ, යෝසෙප්ගේ පීඩාව ගැන ශෝක නොවී සිටින්නාවූ අයට දුක්වේ." (ආමොස් 6:6) සෙනඟගේ පාපය සහ පීඩාව ගැන සැලකිලිමත්ව සිටින අයව උන්වහන්සේ ලකුණක් කර වෙන්කර ගන්නේ කෙසේදැයි බලන්න. ***"ස්වාමීන් වහන්සේ ඔහුට කථාකොට නුවර මුළුල්ලෙහි වනම් යෙරුසලම මුළුල්ලෙහි ගොස් ඒ තුළ කෙරෙන සියළු පිළිකුල්කම් ගැන සුසුම්ලා කෙඳිරිගාන මනුෂ්‍යයන්ගේ නළල්වල ලකුණක් කරපන්නැයි කී සේක. මා අසා සිටියදී උන්වහන්සේ අනික් තැනැත්තන්ට කථාකොට නුඹලා නුවර තුළට ඔහු පස්සේ ගොස් පහරදීපල්ලා. නුඹලාගේ ඇස් දයා නොකෙරේවා. නුඹලා කරුණා නොකරල්ලා. මාගේ ශුද්ධස්ථානයෙන් පටන්ගෙන මහල්ලන්ද, යෞවනයන්ද, කන්‍යාවන්ද, බාලයන්දස්ත්‍රීන් ද, මරා නාස්තිකර දමාපල්ලා නුමුත් ලකුණ ඇති කිසිවෙකුට ළං නොවෙල්ලා යයි කී සේක. එවිට ඔවුහු ගෘහය ඉදිරියෙහි සිටි වැඩිමහල් මනුෂ්‍යයන්ගෙන් පටන්ගත්තෝය."***
(එසකියෙල් 9 : 4 - 6)

මනුෂ්‍යන්ගේ ආත්ම ගැන දැඩි පිපාසයෙන් සිටින අයගේ ආශාව සම්පූර්ණ කරන සේක

පිඹීදීම උදෙසා අපගේ මුළු හදවතින්, මුළු ආත්මයෙන්, මොරගසන පිණිස දෙවියන් වහන්සේ අපව යොමු කරන සේක. හදවතින්ම මොරගසන්නාවූ අයගේ යාච්ඤාවලට පිළිතුරු ලබා දෙමින් ශුද්ධ වූ දෙවියන් වහන්සේම උන්වහන්සේගේ පුත්‍රයාණන්ගේ ලේවලින් මනුෂ්‍යයන් මිදීම වෙතට ගෙන එන සේක. ***"දෙවියන් වහන්සේත් තමන්ට රෑ දහවල් හඬගසන්නාවූ තමන් තෝරාගත්තවුන් ගැන යුක්තිය ඉෂ්ට නොකරන සේක්ද, ..? උන්වහන්සේ ඔවුන් කෙරෙහි බොහෝ ඉවසිල්ලෙන් සිටින සේක. (ලූක් 18:7) තවද, ඔවුන් විසින් නොමැලිව නිතර යාච්ඤා කරන්ට ඕනෑ බව දක්වන පිණිස උන්වහන්සේ ඔවුන්ට උපමාවක් කියනසේක්"*** (ලූක් 18:1)

පැමිණෙන්නාවූ පිබිදීම පිළිබඳව ලිවීමට ශුද්ධාත්මයාණන් වහන්සේ යොවේල් අනාගතවකතෘට දේවානුභාවය ලබා දෙමින් හදවතේ පිපාසය පුබුදුවාලූ සේක. එමෙන්ම මෙම අන්තිම දවස්වලදී යටහත්ව යාච්ඤා කරන්නාවූ දෙවියන් වහන්සේගේ ශුද්ධවන්තයන්ව පුබුදුවාලීම සහ සභාවට අහිමිවී තිබෙන්නාවූ දෙවියන් වහන්සේගේ පොරොන්දුවේ කාරණා මත රැඳී සිටිමින් ඒවා සම්පූර්ණ වන බව විශ්වාස කිරීමටත් පුබුදුවනු ලබන සේක. (යෝවෙල් 2:25-27) දෙවියන් වහන්සේ ස්වර්ගීය වර්ෂාව අප වෙතට එවන සේක. ස්වාමී වූ යේසුස් වහන්සේගේ නැවත පැමිණීමට අපව පිළියෙල කරමින් අස්වැන්න නෙලීමේ වර්ෂාව සඳහා ආත්මයාණන් වහන්සේව අප වෙත වගුරුවනු ලබන සේක. ප්‍රථම සහ අන්තිම වර්ෂාව යන දෙකම වුවත් පළමු මාසයේදීම එවනු ලැබීමට හැකියාව තිබෙන සේක. (යෝවෙල් 2:21-32)

දෙවියන් වහන්සේගේ පිළිතුර ලැබෙන තෙක් ඔබගේ හදවත ශුද්ධාත්මයාණන් වහන්සේ තුළ තබාගෙන පිබිදීම උදෙසා ඇදහිල්ල මත රැඳී සිටිමින් යාච්ඤා කරන්න. ඊළඟට යේසුස් වහන්සේ පැමිණෙන තෙක් නොකඩවා කීකරුව සහ ඇදහිල්ල තුළ ආත්මයාණන් වහන්සේ සමග ක්‍රියා කරමු. (ගලාති 5:16)

අණුවන කන්‍යාවියන් මෙන් ඔබගේ තෙල් සොරා ගැනීමට ඉඩ නොහරින්න. (මතෙව් 25:1-13)

යේසුස් වහන්සේ අන්ධයන් දෙදෙනාට මෙසේ පැවසූ සේක. ***"එවිට උන්වහන්සේ ඔවුන්ගේ ඇස් අතගා නුඹලාගේ විශ්වාසයේ ප්‍රකාරයට නුඹලාට වේවායි කී සේක."*** (මතෙව් 9:29) ශුද්ධාත්මයාණන් වහන්සේ කරුණු කොටගෙන ක්‍රියාකරමින් දෙවියන් වහන්සේගේ පිබිදීම උදෙසා ඔබගේ හදවත තුළ ඇති පිපාසයේ සෑම කුඩා කොටසක්ම සහ ඔබගේ ඇදහිල්ලේ සෑම කොටසක්ම ඉතා ආදරයෙන් අල්ලාගෙන සිටින්න. ඔබගේ පහන් පිළියෙල කරගෙන ඇදහිලි නැති විරුද්ධවාදීන්ගේ සාකච්ඡාවලට පංගුකාර නොවී සිටින්න. ඔබගේ හදවතේ ගැඹුරෙන් ශුද්ධාත්මයාණන් වහන්සේට කීකරුව යාච්ඤා කරන්න. ***"එබැවින් ස්වාමීන් වහන්සේ ඇදිනා ගනිමු. ඇඳිනගන්ට වීර්‍ය්‍ය කරමු. උන්වහන්සේගේ උදාවීම පහන්වීම මෙන්***

දෙවියන් වහන්සේගේ සහාව පිනිදෙන්න.

ඉහළ යමින් තිබෙන දැඩි කායික සහ මානසික වේදනාවන් සහ මරණයට මුහුණ දෙමින් සිටින ලෝකය මහත් ලෙස මොරගසද්දී සභාව නින්දේ පසුවෙති. දේශගුණික විපර්යාස, භූමිකම්පා වර්ධනයවීම, රජයන් බලයෙන් පහකරනු ලැබීම, සදාචාරය බිඳවැටීම, කිසිවෙක් උද්යෝගීමත්ව නොසිටීම පොදු කාරණයක් බවට පත්වීම ආදී කාරණා බහුලව දකින්නට ඇත.

කාලය කෙටි බව අවබෝධ කරගෙන අප අවිදිවීම අවශ්‍යවේ. සැලකිලිමත් නොවීම සහ අසංවේදීතාවය පිළිබඳව අපෝස්තුළු පාවුල් මෙලෙස අනතුරු අඟවා ඇත. ***"එබැවින් මෙන නැනැත්තන් මෙන් අපි නිදාගෙන මන්නොවී සිටිමු."***(1 තෙසලෝනිකා 5:6) වර්තමාන ලෝකය තුළට දෙවියන් වහන්සේගේ කාර්‍යයේදී අපි කළ යුතු කුමක්දැයි කිතුණු ඇදහිලිවතුන් හඳුනාගෙන තිබෙනවාද ?අපි අලසකමින් සිටින බව හෝ නිදැල්ලේ පසුවන බව පෙනෙන්නට තිබෙනවාද?අපි පහසුවෙන්ම අන්තරායකාරී දේවලට හසුවෙනවා සහ දෙවියන් වහන්සේගේ ආඥාවන්වලට ඇහුම්කන් නොදෙන භයංකාර ආත්ම නොසලකා හරිමින් සිටිනවාද? උන්වහන්සේ පැමිණ ධර්මිෂ්ඨකමේ වර්ෂාව අප වෙත වගුරුවන තෙක් උන්වහන්සේව සොයනවාද? (හොෂෙයා 10:12)

තමාටම ප්‍රේමකිරීම, මේ ලෝකයේ දේවලට ප්‍රේම කිරීම වෙනුවට දෙවියන් වහන්සේගේ සෙනඟ යහපත් යුද්ධයෙහි යුද්ධ කිරීමට හැකිවන පිණිස වාතාවරණය පිළියෙල කළ යුතුය. ඔවුන්ගේ උදාසීන ස්වභාවයට (අනිත් අයගේ වේදනාව නොදනෙන ස්වභාවයට) සහ මේ පැයේ දී ඔවුන්ගේ අක්‍රීයකම්වලට සමාවට කරුණු ඉදිරිපත් කරනවා වෙනුවට යහපත් යුද්ධයෙහි යෙදී සිටීමට යොමු කළ යුතුය.

තමාටම ප්‍රේමකිරීම

දේශකයන් සහ සෙනඟ තමාගේ නින්දෙ පහසු ගැනීම පිළිබඳව, තමන්ගේ ආහාර පිළිපදව, තමන්ගේ ශාරීරික අලංකාරය පිළිබඳව, බොහෝ සැලකිල්ලක් දක්වති. ඊළඟට ඔවුන් නිවසේ දී, සභාවේ දී සහ සමාජය තුළ දී හදවත් වේදනාවට පත්කරන්නාවූ (දැඩි කම්පනයක් ඇති කරන්නාවූ) වාතාවරණයන්වල රැඳී සිටින්නෝය. අනිත් කිතුණුවන් පීඩාවට පත්ව සිටීම සහ පාපය තුළ සිටින මනුෂ්‍යයන්ට ද්වේශ කරන නිසා සේවය පිළිබඳව උද්යෝගය හීනවීම, දෙවියන් වහන්සේගේ වචනයට හදවත්වලින් පංගුකාරත්වය නොදැක්වීම සහ කඳුළු සලමින් කණගාටුවීම හීනිවීගොස් ඇත. ඊට හේතුව වර්තමානයේ දී ලෝකයේ ආත්මික ස්වභාවය බිඳවැටී තිබීමයි. ප්‍රසව වේදනාව විඳීම තුළ සියොන් දරුවන් ගෙන ඒමට දේවියන් වහන්සේ නියමකර තිබෙන සේක. (යෙසායා 66:8) ***"ඔබගේ නාමය කියා යාච්ඤා කරන්නා වූ ඔබ අල්වා ගන්න පිණිස තමාම ප්‍රබෝධ කරගන්නාවූ කිසිවෙක් නැත....."*** (යෙසායා 64:7)

යාච්ඤා රැස්වීම් පාලුව තිබෙද්දී මුළු රාත්‍රියේම රූපවාහිනිය නරඹන්නෝය

ස්වාමීන් වහන්සේව සෙවීමට ශුද්ධ ලියවිල්ල තුළ කර ඇති කැඳවීමෙන් මේ අන්තිම කාලයේ දී

සාරා ෆ්ලූකස් මෝරේ විසිනි

බොහෝ සේ ඇත්ව ගොස් සිටින්නෝය. ලවෝදික සභාව පොහොසත්ව සහ ලෞකික දේවලින් වර්ධනය වී සිටියෝය. ඔවුන්ගේ පෙනීම අඳුරු වී නොතිබුණේය. නමුත් ඔවුන් ඇල්මැරී සහ ලෞකික කමට යටත්ව සිටිය නිසා ඔවුන් තමන්ගේ අනාගතය ගැන (සදාකාලය ගැන) නොසිතන බව ස්වාමීන් වහන්සේ දුටු සේක. (එළිදරව් 3:14 - 22)

මේ ආකාරයෙන්ම වර්තමානයේදි ද යාච්ඤා කිරීම සඳහා ආත්මයාණන් වහන්සේ කරන්නාවූ කැඳවීම නොසලකා හැර තිබෙන්නේය. යාච්ඤා රැස්වීම් අත්හැර දමනු ලබන්නෝය. යාච්ඤා රැස්වීම් කාන්තාරයක් මෙන් හිස්ව පවතින්නේය. දෙවියන් වහන්සේ සෙකඟ නිවස තුළ දී පහසුවෙන්ම රූපවාහිනියට ඇළුම්ව සිටිනවා හෝ සෑම ස්ථානයකදීම තමන්ගේම මාර්ග වලින් විනෝදාත්මක දේවල නිරතවී සිටිනවා සොයාගත හැකිය. මනුෂ්‍යයන් අපරීක්ෂාකාරීව සිටින බැවින් නෝවාගේ දවස්වලදී මෙන් විනිශ්චය ලෙස දේව උදහස හදිස්සියෙන්ම පැමිණ සඵලත්වය අහිමිවී යන බව අනතුරු අඟවන සේක.

දෙවියන් වහන්සේට අයිතිව සිටි සියොන් සෙනඟ පිළිබඳව මහත් වූ අප්‍රසාදය පලකරන සේක. (ආමොස් 6:1) යම් කෙනෙක් සැලකිලිමත් නොවී උද්යෝගිමත්ව අසා නොසිටීම සහ නිදහසේ තම ජීවිතයේ ආශාවන්හි ගැලී සිටීම නිසා නිශ්චිතවම ඔවුන්ගේ හදවත්වල දෙවියන් වහන්සේගේ උදහස පවතින බව

6 පිටුවට

"කාන්තාරයෙහි ස්වාමීන් වහන්සේගේ මාර්ගය සාදා, අපේ දෙවියන් වහන්සේට වනයෙහි මාවතක් සමතලා කරපල්ලා " (යෙසායා 40:3)

මනුෂ්‍යයන් යාච්ඤා කරන විට දෙවියන් වහන්සේගේ ක්‍රියාව

(විවිධ වූ මූලාශ්‍ර වලින් එකතු කර සකස් කරන ලද ලිපියකි.)

අප නිවැරදි ලෙස යාච්ඤා කරන්නේ නම් අපගේ යාච්ඤාව කරුණාකොටගෙන දෙවියන් වහන්සේ ලොව වටා පිඹිදීම ඇතිකරන සේක. අපි ජීවත්වන පිණිස දෙවියන් වහන්සේට මොරගැසිය යුතුය. ***"ඔබගේ සෙනඟ ඔබ කෙරෙහි ප්‍රීතිමත් වන පිණිස අප නැවත ජීවත් නොකරන සේක්ද, ... ?"*** (ගීතාවලිය 85:6) සියොන් පවුරේ සිට මුරකරුවා මොරගසන්නාක් මෙන් අපි මොරගැසිය යුතු බව ගීතිකා කරුවා පෙන්වා දෙන්නේය. ***"ස්වාමීන් වහන්සේ විසින් ක්‍රියාකිරීමට සුදුසු කාලය දන්ය. මක්නිසාද, ඔවුහු ඔබගේ ව්‍යවස්ථාව කඩ කළෝය."*** (ගීතාවලිය 119:126)

පිඹිදීම යනු කුමක්දැයි අවබෝධකර ගැනීමට ප්‍රථමයෙන් අවධානය යොමු කරමු. පිඹිදීම යනු කාලය වේගවත් කරනවා හෝ ජීවිතය උගන්වනවා (සන්නිවේදනය කරනවා) වන්නේය. දෙවියන් වහන්සේට පමණක් ජීවිතය ලබාදීමට පුළුවන්කම තිබෙන සේක. දෙවියන් වහන්සේ උන්වහන්සේගේ සෙනඟව බැහැදකින විට පිඹිදීම ඇතිවේ. ශුද්ධාත්මයාණන් වහන්සේගේ බලය කරුණාකොටගෙන ඔවුන්ට නව ජීවිතයක් ලබාදෙන සේක. එමෙන්ම ඔවුන්ට ලබාදෙන්නාවූ නව ජීවිතය තුලින් පව්කරවැන්ගේ බෙලහීන සහ පාපිෂ්ඨ ජීවිත වෙසන්කර නව ජීවිත බවට පත්කර පිඹිදීම ගෙන එන සේක.

ලොව වටා මනුෂ්‍යයන් ආත්මිකව විනාශවී තිබීම සහ අසරණව සිටීම පිඹිදීම අවශ්‍යවීමට හේතුවයි. එය එක රටකට සීමාවූවක් නොවේ. එය නිවෙස් තුළත්, සෝවාවන් තුළත් දැකිය හැකිය. අපට ශුද්ධාත්මයාණන් වහන්සේගේ බලය කරුණාකොටගෙන ගැඹුරු විශාල ලෙස පැතිරුණාවූ ලොව වටා පවතින්නාවූ පිඹිදීමක් අවශ්‍යව තිබේ. ලොව වටා හෝ සභාවේ, ප්‍රදේශයේ, නිවසේ, විනාශය නතරවන්නාවූ පිඹිදීමක් අවශ්‍ය වන්නේය. ඊළඟට අපි කළ යුත්තේ කුමක්ද ...? යාච්ඤා කිරීමයි. ගීතිකාකරුවා මෙන් යාච්ඤා කරන්න. ***ඔබගේ සෙනඟ ඔබ කෙරෙහි ප්‍රීතිමත්වන පිණිස අපව නැවත පිඹිදෙව්ව මැනව.*** එසකියෙල් මෙන් යාච්ඤා කරන්න. ***ස්වාමී වූ දෙවියන් වහන්සේ කියන සේක. එම්බා ආත්මය නුඹ පෙර දිශා සුළං වලින් ඇවින් මැරුම්කෑවාවූ මොවුන් ජීවත්වන ලෙස මොවුනු තුලට හුස්ම හෙළාපන්න කියා කියාපන්නැයි මට කීය.*** සෙකියෙල් 37:9) අපි දෙවියන් වහන්සේගේ ආත්මයාණන් වහන්සේ පැමිණ උන්වහන්සේගේ සෙනඟ පුබුදුවාලන තෙක් යාච්ඤා තරනවාද ...?

යාච්ඤා කිරීම පිඹිදීමේ කොඳු ඇට පේළියයි.

දවස් දහයක් එක්රැස්වී යාච්ඤා කිරීම තුළ කිතුණු ඉතිහාසයේ ප්‍රථම මහත් වූ පිඹිදීම ඇති විය. ගෝලයන් එක්ව යාච්ඤා කළ බව අපි ශුද්ධ ලියවිල්ල තුළ කියවන්නෙමු. ***"මේ සියල්ලෝම ස්ත්‍රීන්ද, යේසුස් වහන්සේගේ මව් වූ මරියා ද, උන්වහන්සේගේ සහෝදරයෙන්ද, සමඟ එක්සිත්ව නොකඩවාම යාච්ඤා කරමින් සිටියෝය."*** (ක්‍රියා 1:14) සියළුම සැබෑ පිඹිදීම්ක්ම පෙන්තකොස්ත දවසේදී මෙන් යාච්ඤා කිරීම තුළ හටගන්නේය.

දහඅටවන ශතවර්ෂයේ දීජෙතන් එඩ්වඩ් යටතේ හටගත් පිඹිදීම යාච්ඤා කිරීමට කැඳවීම සමඟ ආරම්භ වූ බව ප්‍රකටවී තිබේ. බ්‍රිතාඩ් යටතේ ඉන්දියානුවන් අතර කරුණාවේ මහත් පුදුමවූ ක්‍රියාවන් සිදු විය. ඔහු තමාගේ කාර්‍යයන් වලට බලය ලබා ගැනීම සඳහා දෙවියන් වහන්සේ ඉදිරියේ සිට යාච්ඤා කිරීමට කාලය වැය කළේය. චාර්ල්ස් ෆිනි සහ රොචෙස්ටර් යටතේ 1830 දී බලාපොරොත්තු බිඳවැටී තිබුණු නිව්යෝර්ක් නුවර දෙවියන් වහන්සේගේ පිඹිදීමේ බලය ප්‍රකාශයට පත්කරනු ලැබුවේ විශ්වාස කළ නොහැකි සහ බොහෝ දෙනා අතරේ ප්‍රසිද්ධ වූ පිඹිදීමක් ලෙසින්ය. එය එංගලන්තයට පමණක් නොව මහා බ්‍රිතාන්‍යය පුරාම පතලවී ගියේය. ෆිනි යාච්ඤා කිරීමෙහි පැවතීමෙන් මෙම බලයේ ක්‍රියාව අත්දකිමින් ජයග්‍රහණය ලැබුවේය. 1859 දී ඇමරිකා එක්සත් ජනපදයේ පිඹිදීම ආරම්භවීමට හේතුවූයේ යාච්ඤා කිරීම හැර වෙන කිසිවක් නොවේ.

බොහෝ පිඹිදීම් ගැන ලියූවා වූ තියඩෝර් කියුලර් දැල්වෙන්නාවූ හදවත් කිහිපයක් තුළ ගින්න සහ යටහත්කම ආරම්භ වූවායැයි ලියුවේය. කුඩා කාරණාවන්වත් එම දවසේ නොසලකා හැරීමට නුපුළුවන් විය. මාගේ සේවා කාලය තුළ කරුණාවේ සියළු ක්‍රියාවන් කුඩාවට ආරම්භ විය. පුද්ගලික නිවසක යටහත් රැස්වීමක් ආරම්භ වී කණ්ඩායමක් එක් ව දේව වචනය අධ්‍යයනය කළේ යැයි ඩී.එල්. මුඩ් පැවසුවේය.

දෙදෙනෙක් එක්ව යමක් ඉල්ලන්නේ නම් එය ලැබේ. (මතෙව් 18:19)

දේව ධර්මාචාර්‍ය තෝමස් එද්. ස්කිනර් ආච් වීදියේ පිලදෙල්පියා සභාවේ පාලකයාව සිටිද්දී ඔහුගෙන් දේව වචනය ඉගෙන ගැනීමට පැමිණි උද්යෝගිමත් තරුණයන් තිදෙනෙකු පිළිබඳව පුදුම වූඋ කථාවක් පවසුවේය. ඔවුන් පොරබඳමින් යාච්ඤා කළා වූ අය විය. ඔවුන් පාපය පිළිබඳව පවිත්‍ර වන්නා වූ හදවත් ඇතිව දෙවියන් වහන්සේ ඉදිරියේ යටහත්ව සිටියෝය. එක් සභාවකට පසුව තවත් සභාවක සේවකයන් පැමිණ ඔවුන් සමඟ යාච්ඤා කිරීමට සම්බන්ධ වූවෝය. ස්වර්ගීය ගින්න වේගයෙන් මුළු සෙනඟ මත ඇවිලී ගියේය. ඉතා බලවත් වූ පිඹිදීමක් එම නගරය තුළට පැමිණි බව අපි දනිමු.

දහසය වන ශත වර්ෂයේ දී අයිර්ලන්තයේ මහත් වූ පිඹිදීමක් ඇති විය. අයර්ලන්තයේ සිටි ප්‍රධානියා බ්‍රිතාන්‍ය කිරුළ වෙනස් නොවී පැවතීමට විරුද්ධව කැරලි ගැසීම කරුණු කොටගෙන නොහික්මුණු අවදානම් සහිත ලෙස පාලනය කලේය. එහිදී සැබෑ සැදැහැවත්කම දැකීම ඉතා දුර්ලභවිය. ස්කොට්ලන්තයේ සහ එංගන්තයේ මන්ත්‍රීවරුන්ගේ වෙනස් නොවූ ස්වභාවය නිසා නීති පද්ධතිය බිඳ වැටුණු රටක් බවට පත්විය. එක් මනුෂ්‍යයෙක් වූ "බ්ලේයාර්" බොහෝ දවසක දිවා රාත්‍රී දෙකෙහි යාච්ඤා කළාය. තනිවම සහ අනිත් අයත් සමඟ එක්ව ඉතා මහත් ලෙස දෙවියන් වහන්සේ ඉදිරියේ මැදහත්කාරකම් කළාය. ඒ හා සමානවම අයර්ලන්තයේ කඳුරු නිර්මානයේ සිට ජේම්ස් නැමති මනුෂ්‍යයා ද කළ මැදහත්කාරකම් කිරීම සැලකිල්ලට ගත යුතුය. අයර්ලන්තයේ කඳුරු නිම්නය මේ මනුෂ්‍යයා යටතේ ක්‍රියා කිරීමට ආරම්භ කළේය.

ඉතිහාසඥයන් මෙම කාලය පිළිබඳව මෙලෙස පවසන්නේය. මේ දේශය නැවත ප්‍රතිසංස්කරණය කිරීමේ දී සෙනඟ අතරේ සේවය කිරීමට දෙවියන් වහන්සේ තෝරාගත් අය අතරේ ඔහු මෙන් ප්‍රඥාවන්ත කෙනෙක් නොවීය. ස්වාමීන් වහන්සේගේ මෙම තෝරා ගැනීමත් සමඟ ඔහු ඉතා ගෞරවයෙන් සහ ප්‍රීතියෙන් දෙවියන් වහන්සේට සේවය කළාය. දෙවියන් වහන්සේගේ තේජස කරුණුකොටගෙන පමණක් ශුද්ධ වූ ජාතියක් මෙම මිත්‍යාදෘෂ්ඨික දේශය තුළ ඇති වූ බව සෑමදෙනාටම පෙනුණේය. එය හටගත්තේ මනුෂ්‍යයාගේ හැකියාවෙන් නොවේය. ***"එකල ඔහු මට උත්තර දෙමින් සෙරුබ්බාබෙල්ට ස්වාමීන් වහන්සේගේ වචනය මේය. එනම් බලයෙන්වත්, ශක්තියෙන්වත් නොව මාගේ ආත්මයෙන් යයි සේනාවල ස්වාමීන් වහන්සේ කියන සේක."*** (නොකරියා 4:6)

ඔහුගේ දේශනාකිරීම්වලට ඇහුම්කන් දුන් විශාල සෙනඟක් අධික උනන්දුවකින් සහ හෘද සාක්ෂියේ ඉතා බියකින් යුක්ත වූහ. ඔවුන් තමන්ගේ ජීවිතවල විනාශයන් දෙස බලා මුනුෂ්‍යයෙනි..., සහෝදරයෙනි..., ගැළවෙන පිණිස අපි කුමක් කළ යුතු දැයි මොරගසමින් ඇසුවෝය. දෙවියන් වහන්සේගේ වචනයේ බලය කරුණුකොටගෙන ඔවුන් තමන්ගේ පාප පිළිබඳව ඉතා තදින් ශෝක වූවෝය. එක් දවසක දී දොළොස් දෙනෙක් මරණයේ දොරටුව අභියස සිටින්නාක් මෙන් සිටිමින් මොරගැසුවෝය. මේ අය අතර සමහරු තම අස්ලවැසියන්ට ගරුසරු නොකළා වූ අයව සිටියෝය. සමහරු නගරයේ මුළු වෙළඳපොලේම කිසිදු බියකින් තොරව කලහකාරී ලෙස හැසිරුණු අය විය. ඔවුන්ගේ ක්‍රියාවන් මුළු ජනසමාජය අතරේම පැතිරී තිබුණි. දැන් ඔවුන් කිතුණුවන්ගේ ධර්මිෂ්ඨකමට පැමිණීමට මහත්සේ ඇළුම් වූ නිසා සැතපුම් තිහක් හෝ හතලිහක් ගමන් කර සුභාරංචිය ප්‍රකාශ කළ අතර නැවත හැරී එන තුරු වෙහෙස හෝ නිදබරවීම කෙරෙහිවත් සැලකිල්ලක් දැක්වූයේ නැත. ඔවුන්ගෙන් බොහෝ දෙනාට කෑම බීමවත් තිබුණේ නැත. එසේ වූවත් ඔවුන් උද්යෝගයෙන් සහ ශක්තිමත්ව සුභාරංචිය ප්‍රකාශ කිරීමට පිටත්ව ගියෝය. මක්නිසාද ඔවුන්ගේ හදවත් දෙවියන් වහන්සේ කෙරෙහි ඇළුම්කමින් පිරී තිබුණෝය.

ඔත්පලවූ මැදහත්කරුවන්

ඩී.එල්. මුඩ් එංගලන්තය, ස්කොට්ලන්තය, අයර්ලන්තය තුළ කාල වූ අනර්ඝ වූ සේවය ගැන ඔත්පලව සිටි ශුද්ධවන්තියක් යාච්ඤා කිරීමට ආරම්භ කළේය. ඇගේ හදවතේ සභාවේ ආත්මික අවශ්‍යතාවයන් උදෙසා දැඩි උද්යෝගයක් තිබුණි. ඩී.එල්. මුඩ් ඇමරිකාවේ සිටිද්දී මෙම කාන්තාව ඇගේ හදවතේ ආත්ම පිළිබඳව තිබූ දැඩි උද්යෝගය නිසා ඩී.එල් මුඩිව ලන්ඩනයේ ඇගේ සභාව වෙතට එවන ලෙස දෙවියන් වහන්සේට මොරගසමින් අයැද සිටි බව ඇගේ ලිපියකින් කියවන්නට ලැබුණි. එක් ඉරිදා උදෑසනක ඇගේ සහෝදරිය උදෑසන දේව මෙහෙයට ගොස් නැවත පැමිණ ඇගේ කාමරයට ගොස් රෝගීව සිටි මෙම සහෝදරියගෙන් මෙසේ ඇසීය. අද උදෑසන දේව මෙහෙයේ දේශනා කළේ කවුද කියා ඔබට සිතන්නට පුළුවන්ද ..? ඩී.එල්. මුඩ් ඇමරිකාවේ සිට පැමිණියේය. රෝගීව සිටි සහෝදරිය දෙවියන් වහන්සේ ඇගේ යාච්ඤාවලට පිළිතුරු ලබා දී ඇති බව අවබෝධ කර ගත්තාය. ඇය පෙර දිනයේ රාත්‍රී ආහාරයවත් නොගෙන පසු දින සවස් යාමට වෙන තෙක් නොකඩවා උද්යෝගිමත්ව යාච්ඤා කළාය. ඊට පිළිතුරු ලෙස දෙවියන් වහන්සේ ඩී.එල්.මුඩිව ගෙනැවිත් ඔවුන්ගේ සභාව තුළ පිඹිදීමක් ඇති කරනු ලැබූ සේක.

උදෑසන දේව මෙහෙය තුළ දේශණා කිරීමට පිළියෙල කරගෙන තිබුණා වූ පණිවිඩය පිළිබඳව ඩී.එල්. මුඩ් සෑහීමකට පත්ව නොසිටි අතර සවස දේව මෙහෙයේ දී දේශනා කළ යුතු පණිවිඩය පිළිබඳවද සිතා කැළඹුණා වූ ස්වභාවයකට පත්ව සිටියේය. නමුත් ඔහු දේශනා කිරීමට ආරම්භ කළ පසු දෙවියන් වහන්සේගේ බලය ඒ ස්ථානයේ ක්‍රියාත්මක වෙමින් පවතින බව ඔහු අවබෝධ කරගත්තේය. දේව මෙහෙය අවසානයේ දී යේසුස් වහන්සේව පිළිගැනීමට කැමති අයට සිට ගැනීමට අවස්ථාවක් ලබා

6 පිටුවට

පිබිදීමේ බලාපොරොත්තුව

ඩේව් බට්ස් විසිනි

විලියම්ස් සහ ඇන් නිව්යෝර්ක් නගරයේ වීදියේ සිටින විට ප්ලූටන් කෙළවරේ බොහෝ දේ දකින්නට හැකි වූයේ නැත. කලින් තිබුණා වූ ලෝක වෙළඳපොලේ ගොඩනැගිලි පද්ධතියේ ගොඩනැගිලි තුනක් එහි පිහිටා තිබුණි. ඊට අමතරව මෙම මන්සන්ධියේ වෙන කිසිවක් හඳුනා ගැනීමට හැකි ලෙස තිබුණේ නැත. එසේ නොමැති නම් එහි ඉතිහාසය කෙබඳුදැයි ඔබ දන්නවා යයි මම සිතමි.

අවුරුදු එකසිය පනහකට පෙර මෙම මංසන්ධියේ තිබූ කුඩා සභාවක් දෙවියන් වහන්සේ තෝරාගෙන මෙම ජාතියටත්, ලොව වඩා බොහෝ සෙනඟ අතරේත් පිඹීදීම ඇති කළ සේක. ගිහි අයගේ යාච්ඤා කිරීම තුළින් ඇතිවුනා වූ තුන්වන මහත් පිඹීදීම ලෙස අපි මෙය දැන සිටින්නෙමු. 1857 සැප්තැම්බර් 23 වෙනිදා පැවතුණා වූ රැස්වීම තුළ ආත්මික ගින්දර ඇවිලීමට පටන් ගෙන පුද්ගලයන් මිලියනයකට අධික සංඛ්‍යාවක් ක්‍රිස්තුස් වහන්සේගේ රාජ්‍යය වෙතට ගෙන එනු ලැබුවේය. එමෙන්ම සංස්කෘතික ආක්‍රමණය තුළ ඇති වී තිබූ ද්වේශ සහගත ස්වභාවය නිසා හටගත් සිවිල් යුද්ධය ආත්මික ගින්න මධ්‍යයේ මකා දමනවා දකින්නට ලැබුණි.

එහිදී වඩා නිවැරදිව පවසනවා නම් දෙවියන් වහන්සේ සභාවට වඩා වැඩියෙන් පුද්ගලයෙක්ව තෝරාගෙන තිබූ බව පෙනෙන්නට විය. යෙරමියා ලැම්පියර් ඔහුගේ නම වූයෙය්. ඔහු කලින් ව්‍යාපාරිකයෙක් වූයෙය්. ලැම්පියර් ගිහි මිෂනාරිවරයෙක් බවට පත් විය. 1857 දී නිව්යෝර්ක් නගරය මත බලපෑමක් ඇති කිරීම ඔහුගේ ඉලක්කය විය. රැකියා විරහිතව නිව්යෝර්ක් නගරයේ පමණක් නිකරුනේ කාලය ගත කළ පනස් දහසක් මනුෂ්‍යයන් ඔහුගේ ප්‍රධාන ගැටළුව බවට පත් විය. වහල්කම සහ ආර්ථික ප්‍රතිපත්තීන් මත කොටස්වලට බෙදී සිටීම එවකට ජාතිය (අමරිකානුවන්) මුහුණ දී තිබූ මහා බලවත් වූ අර්බුධකාරී තත්ත්වයයි. දෙවන මහත් වූ පිඹීදීමෙන් හටගෙන තිබූ බලය බොහෝ ස්ථාන වලින් ක්‍රමක්‍රමයෙන් පිරිහීයාමට සහ සභාව බලය රහිතව සිටීම නිසා ජාතිය නාස්තිවී තිබීමට ප්‍රතිචාරය දැක්වීම අවශ්‍ය වී තිබුණි.

ඉතිහාසයේ මෙම අවධානම් (තීරණාත්මක) අවස්ථාවේ දී මනුෂ්‍යයෙකුට සරල අදහසක් පැමිණියේය. එනම්, ව්‍යාපාරිකයන් මධ්‍යයනයේ දී එක්ව නගරය සහ ජාතිය උදෙසා යාච්ඤා කළ යුතුය යන්නයි. ලැම්පියර් නිව්යෝර්ක් නගරයේ ආර්ථික දිස්ත්‍රික්කය තුළ සිටිනඅ යට සැප්තැම්බර් 23 වෙනිදා මධ්‍යනයේ යාච්ඤා කිරීමට පැමිනෙණ ලෙස නගරය පුරා දැන්වීම් අලවනු ලැබීය. එදින ඔහු ඒ මධ්‍යානයේ දී විනාඩි විස්සක් තනිවම යාච්ඤා කළේය. අවසානයේ දී තවත් මනුෂ්‍යයන් පස් දෙනෙක් ඔහුට එකතු විය. යාච්ඤා රැස්වීම අවසානයේ දී ඔවුන් ඊළඟ සතියේත් මෙම යාච්ඤා රැස්වීම පැවැත්වීමට ලැම්පියර්ව ධෛර්‍යමත් කළේය. ඒ අනුව ඊට පසු සතියේ පැවැත් වූ යාච්ඤා රැස්වීමට විසි දෙනෙක් සම්බන්ධ වූවෝය. සති කිහිපයකට පසුව ව්‍යාපාරිකයන් දහස් ගණනක් සහ තවත් අය එක්ව ස්වාමීන් වහන්සේගේ මුහුණ සෙවීමට සම්බන්ධ වූවෝය. පිඹීදීම ආරම්භ විය.

මෙම පිබිදීමේ විශේෂ ලක්ෂණයක් වූයේ බලවත් පාලකවරුන් තුළින් එය ආරම්භ වූයේ නැත. සාමාන්‍ය කිතුණුවන් එක්ව ජාතිය උදෙසා යාච්ඤා කරමින්, ශුද්ධ ලියවිල්ල කියවමින්, ගීතිකා ගායනා කරමින්, සාක්ෂි දරමින් කටයුතු කරනු ලැබුවෝය. දෙවියන් වහන්සේගේ බලය කරුණාකොටගෙන ඔවුන්ගේ ජීවිත වෙනස්වීමට පටන් ගැනීමෙන් ඔවුන්ගේ නොඇකහිලිකාර මිතුරන් සහ සහකාර සේවකයන් ස්වාමීන් වහන්සේ වෙතට ඇදීඒමට පටන් ගත්තෝය. ජීවිත වෙනස්වී සමාජය මුහුණ දුන්නා වූ ප්‍රශ්නවලට විසඳුම් අත්දැකීමට පැමිණියෝය.

මා සමඟ යාච්ඤා කිරීමට සම්බන්ධව සිටින නායකයන් සමඟ ප්ලූටන් වීදියේ පිහිටි එම ස්ථානයට අවුරුදු කිහිපයකට පෙර ගියෙමි. අවුරුදු එකසිය පනස් අටකට පෙර ඉතිහාසයේ දී මැදහත්කාරකමේ යාච්ඤා කිරීම කරුණාකොටගෙන දෙවියන් වහන්සේ ප්‍රකාශ වූ ස්ථානයේ අපි සිටගෙන සිටි අතර නිව්යෝර්ක් නගරය සහ ලොව වටා සෑම තැනකම අපගේ කාලයේ දී නැවත එලෙස පිඹීදීම එවන ලෙස අපි යාච්ඤා කළෙමු. දෙවියන් වහන්සේගේ දෑතේ පාවිච්චි වෙන්නා වූ භාජන ලෙස අපි අපගේ ජීවිත උන්වහන්සේට කැප කරමින්, යාච්ඤා කරමින් සහ ක්‍රියා කරමින් සිටියෙමු. අපගේ ජාතිය සහ අපගේ ස්ථාන වෙනුවෙන් හබක්කුක් 3:2 සඳහන් ආකාරයෙන් යාච්ඤා කළෙමු. ස්වාමීන් වහන්ස ..., මම ඔබගේ ප්‍රවෘත්තිය අසා බයවීමි. **"ස්වාමීන් වහන්ස ..., අවුරුදු අතරතුරේ ඔබගේ ක්‍රියා කිරීම ප්‍රාණවත් කළ මැනව. අවුරුදු අතරතුරේ දැන්වුව මැනව. උදාසේදී අනුකම්පාව සිහි කළ මැනව."**

අතීතයේ දී දෙවියන් වහන්සේගේ ක්‍රියා කිරීම නිසා ඇතිව තිබුණා වූ වටිනාකම මතකයට නැගීමෙන් එවැනි යමක් ප්ලූටන් වීදියේ සිදු විය හැකිද .. ? බයිබලීය සත්‍යතාවය තුළ එවැනි බලපෑමක් නිශ්චිතවම සිදු විය හැකි බව වාර්තා කර ඇත. අතීතයේ දී සිදුවුණා වූ සිදුවීම් තුළ බලාපොරොත්තුව සහ ධෛර්‍යමත්කම ඊශ්‍රායෙල් සෙනඟ අතරේ බොහෝ අවස්ථාවලදී නැවත ඇතිවූ බව සඳහන් කර තිබේ. යෙසායා 63 වන පරිච්ඡේදයේ දී මෝසෙස්ගේ ජීවිතය තුළ සිදු වූ ආකාරයෙන් තමන්ගේ දවස්වලදීත් දෙවියන් වහන්සේගේ ක්‍රියාව සිදු නොවන සේක්දැයි අනාගතවකතෘ යෙසායා දෙවියන් වහන්සේගේන් අසා සිටින්නේය. දෙවියන් වහන්සේ අතීතයේ දී ඊශ්‍රායෙල් සෙනගව නැවත උන්වහන්සේ වෙතට ගෙන මේ පදනම මත සිට පිඹීදීම උදෙසා මහත් වූ යාච්ඤාවක් යෙසායා 64 වන පරිච්ඡේදයේ දී කර ඇත.

පිබිදීම උදෙසා අතීතයේ දී දෙවියන් වහන්සේ මහත් ලෙස ක්‍රියා කරනු ලැබූ ආකාරය නැවත ගණනය කිරීමෙන් අපගේ දවස්වලදීත් එවැනි පිඹීදීමක් වෙනුවෙන් ඇදහිලිවන්තයන්ට ඔවුන්ගේ හදවත් උද්යෝගිමත් කරගත හැකිය. ආත්මික ඉතිහාසය තුළ සිදුවූ දෙවියන් වහන්සේගේ ක්‍රියාකිරීම මතකයට නගා ගැනීම නිකම්ම අවධානයට ලක් කරන්නාවූ දෙයක් නොව නමුත් එය බයිබලීය ක්‍රමවේදය සහ පිවමන දෙවියන් වහන්සේ සමඟ සමීප සම්බන්ධතාවය නැවුම්කර පිළියෙල කර ගැනීම සඳහා ඉතා ඇළුම්විය යුතුව තිබෙන කාරණයකි. අතීතයේ දී සිදුවූ පිඹීදීම් ක්‍රිස්තුස් වහන්සේගේ ශරීරය තුළට ගෙන ඒම උදෙසා උද්යෝගය නිර්මාණය කිරීමට පුළුවන් වූ අවස්ථාවක් සපයා දෙන බව මතකයේ තබාගන්න.

කැඳවීම් තුළ සම්බන්ධවෙන්න.

අතීතයේ දී සිදුවුනාවූ ඕනෑම සිදුවීමකට වඩා පිඹීදීමක් සභාව තුළ ඇතිවීමට මා සමඟ යාච්ඤා කිරීමට සම්බන්ධවීමට ඔබට පුළුවන්ද ... ? පුලුටන් විදියේ සිදු වූ ලෙස ඔබ ජීවත්වන ප්‍රදේශයේ නැවත දේවයන් වහන්සේගේ බැහැ දැකීම උදෙසා උන්වහන්සේගෙන් අයැද සිටින්න. ඉතිහාසය තුළ දෙවියන් වහන්සේ ක්‍රියා කළේ කෙසේ දැයි දකිමින් හබක්කුක් අනාගතවකතෘ මෙන් යාච්ඤා කරන්න. **"ස්වාමීන් වහන්ස ..., මම ඔබගේ ප්‍රවෘත්තිය අසා බයවීමි. ස්වාමීන් වහන්ස ..., අවුරුදු අතරතුරේ ඔබගේ ක්‍රියා කිරීම ප්‍රාණවත් කළ මැනව. අවුරුදු අතරතුරේ දැන්වුව මැනව. උදාසේදී අනුකම්පාව සිහි කළ මැනව."** ප්‍රධාන කිතුණු නායකයන් සමඟ මේ ජාතිය උදෙසා කටයුතු කිරීමට කලින් තිබුණාට වඩා මහත් වරප්‍රසාදයක් මට ලැබුණි. එම මොරගැසීම ඔවුන් සියළුදෙනාත් කරනවා මම ඇසූවෙමි. එකම උවමනාව වූයේ මේ ජාතියේ පිඹීදීම වෙනුවෙන් සේවය කිරීම පමණි.

ඇමරිකාවේ (ඔබගේ රටේ) අනාගතයේ යතුර සභාවයි. අපේ ජාතියේ මනුෂ්‍යයන් එය විශ්වාස කරන්නේ නැත. සංස්කෘතිය විසින් අපව (සභාව) නොවැදගත් ලෙස සලකා පැත්තකට දමා තිබෙන නමුත් දෙවියන් වහන්සේ එසේ නොකරන සේක. උන්වහන්සේගේ සභාව තුළත් අපගේ ජාතිය තුළත්, ක්‍රියාකරන සේක. සභාව බලය රහිතවීමේ සහ දුර්වලවීමේ ප්‍රතිඵල නිසා ජාතිය ජයග්‍රාහී මාර්ගයෙන් පරාජිත මාර්ගයට පැමිණ තිබීම සැබෑ තත්ත්වයයි. දෙවියන් වහන්සේගේ සාවධීනත්වය, සාධාරණත්වය සහ ධර්මිෂ්ඨකම ලුහුබැඳයාම වැනි මූලාශ්‍රවලින් අප වෙන්ව සිටින අතර ස්වාධීනත්වය සහ සාධාරණත්වය පිළිබඳව අනිත් අයට නොකඩවා අනතුරු ඇඟවීමට ඇමරිකාවට පුළුවන් බව අපි සිතා සිටීම අණුවන ක්‍රියාවකි. නමුත් ඒ අතරම අපගේ ජාතිය මුහුණ දෙන අර්බුධවලට වෙනත් අයට චෝදනා කිරීමට පහසුවෙන් යොමුවී තිබේ. එබැවින් සත්‍යතාවය පෙන්වාදීමට සභාව ඉදිරිපත් විය යුතුය. අපි සිටින්නාවූ තත්ත්වය ගැන තෘප්තියට පත්නොවී අපි සිරවී සිටින්නාවූ ස්ථානවලින් මදක් පිටතට ඇවිත් අපගේ තත්ත්වය පිළිබඳව වඩා ඕනෑකමින් සැලකිලිමත් විය යුතුය. මක්නිසාද මනුෂ්‍යයන් දෙවියන් වහන්සේගේ කාරණා සෙවීම (ලුහුබැඳයාම) තුළ තෘප්තියට පැමිණීමට ක්‍රියාකරන්නේ නැත. අපගේ ජාතිය හැම අංශයකින්ම ඇයට විරුද්ධව පවතින දැඩි ප්‍රහාරවලට ඔරොත්තු දී ස්ථාවරව පැවතීමට නම් සභාව තුළ තවත් මහත් වූ ආත්මික පිබිදීමක් අවශ්‍යව තිබේ. එය අතිශොක්තියක් නොව එය සත්‍යතාවයයි. අපගේ ජාතියේ ජීවය රැඳී පවතින්නේ සභාවේ පිඹීදීම මතයි.

පිබිදීම යනුවෙන් හඳුන්වන්නාවූ මෙම කාරණය කුමක්ද ..? සභාව තුළ දෙවියන් වහන්සේගේ අභිමුඛත්වය ප්‍රකාශ වී ජීවිත වෙනස්වීමේ අසාමාන්‍ය ක්‍රියාමාර්ග සිද්දවෙන්නා වූ අවස්ථාව අත්දැකීම පිබිදීමේ ලක්ෂණ ප්‍රකාශ වන්නාවූ මාර්ගයයි. පිබිදීමේ බලපෑම සභාවේ හෝ පුද්ගලික කිතුණු ජීවිතවල සිදුවීම ආරම්භවීමත් සමඟ සෑම දෙයකදීම දෙවියන් වහන්සේ වෙනුවෙන් ජීවත්වීමට අභිප්‍රාය කරගනු ලබන්නෝය. එහිදී කිතුණුවන් ඔවුන්ගේ ඇදහිල්ල බෙදා ගැනීම නිසා විශාල සුභාරංචි සේවයක් නිතරම ඇතිවන්නේය. එහි ප්‍රතිඵලය ලෙස පිඹීදීම නොඇදහිලිවන්තයන් කරා පැතිරී යනු ඇත. සභාව තුළින් ආත්මික පිඹීදීම පැතිරීයාමේ ස්වභාවය පාවිච්චි කරමින් නිතරම සංස්කෘතිය වෙනස් කරනු ලබන්නේය.

ඇමරිකා එක්සත් ජනපදයේ මහත් පිඹීදීමේ ස්වල්පයක් ඇතිවී තිබෙන අතර ප්‍රාදේශීය වශයෙන් පිඹීදීම් බොහෝමයක් ඇති වී තිබේ. සංඛ්‍යාව පිළිබඳව හැමදෙනාම එකඟ නොවූවත් මහත් පිඹීදීම් තුනක් ඇමරිකා එක්සත් ජනපදය තුළ ඇති වී තිබෙන බව පැවසිය යුතුය. මෙම පිඹීදීම් වලින් ශක්තිමත් වූයේ සභාව පමණක් නොව නුමුත් සැකිය යුතු වැදගත් ලෙස අපගේ සංස්කෘතිය වෙනස්වීමට රැගෙන ආවේය.

8 පිටුවට

ශුද්ධාත්මයෙන් පූර්ණවීමට පොරොන්දුව මත රැඳී සිටින්න.

චාර්ල්ස් එස්. ප්‍රීස් විසිනි

අපි ප්‍රකාශ කරන්නේ කුමක්ද .... ? සහ අපි හිමිකරගන්නේ කුමක්ද ..? යන කාරණා දෙක අතර විශාල පරතරයක් පවතින්නේය. අපි බයිබලය කියවන විට සහ එය විශ්වාස කරන වි ටමහත් වූ කාර්‍යයන් කළ හැකිවන්නේය. (යොහාන් 14:12) අපගේ ස්වාමීන් වහන්සේගේ පොරොන්දුවේ ආභිර්වාදය අපි කෙලින්ම පිළිගන්නා අතර ඒ හා සමගම ඇදහිල්ලේ බලයද ඉතා දැඩිව තිබෙන බව පිළිගන්නෙමු. යාච්ඤාවට පිළිතුරු වශයෙන් දේව මහිමය සහ හාස්කම් අපි අත්දකින්නෙමු. අපි යාච්ඤා කිරීමට ආරම්භ කරන විට සමහර කාරණා සමීපයේ තිබෙන බව සහ ඒ අතරම බොහෝ ඇතින් තිබෙන්නාවූ එළියාගේ සළුව අපගේ උරහිස මත වැටී තිබෙන්නාක් මෙන් පෙනෙන්නේය. එය පාවිච්චි කර නැවත ගඟ දෙබෑකර එළියාගේ දෙවියන් වහන්සේව මුළු ලෝකයටම හඳුන්වාදීමට යාච්ඤාවෙහි රැඳී සිටිමු.

යේසුස් වහන්සේ පොරොන්දුවුනාවූ බලය ලබා ගැනීමට අපි පිපාසයෙන් සිටින්නේ නැද්ද .. ? ස්වාමීන් වහන්සේගේ අභිමුඛත්වයේ තේජස අපට අවශ්‍ය කරන්නේ නැද්ද .... ?

සැබවින්ම කරුසපත්වීම

ඔබ ඔබවම ප්‍රසිධියට පත්කර ගැනීමට යාමෙන් ලැජ්ජාවට පත්ව සිටිනවාද ... ? වැඩි වශයෙන් ඔබව ප්‍රසිද්ධියට පත්කර ගනිමින් සුළු වශයෙන් යේසුස් වහන්සේව ප්‍රසිද්ධියට පත්කරමින් සිටිනවාද .. ? යේසුස් වහන්සේ කුරුසපත්වූවනාක් මෙන් තමාවම කුරුසපත්කර ගත හැකි විය යුතුය. එය එක් ආකාරයකින් න්‍යායාත්මක කාරණයක් වශයෙන් පැවසිය හැකිය. නමුත් තවත් ආකාරයකින් පරීක්ෂණාත්මක කාරණයක් ලෙස පැවසිය හැකිය. එහිදී මනුෂ්‍යයන් කුරුසපත්වීම හඳුනාගනු ලබන්නේ ආගමික සිද්ධාන්තයක් වශයෙන් මිස සැබවින්ම කළ යුතු දෙයක් ලෙස නොවේ. මාංශය, තමකම සහ අපගේ පොළවේ කාරණාවන් කුරුසපත් කළ යුතුය. දෙවියන් වහන්සේ සමඟ කථා කිරීමට, ගමන් කිරීමට අපට සමහර දේවල් අහිමිකර ගැනීමට සිදුවේ.

බොහෝ දේ උදෙසා පිපාසිත වෙන්න.

පිපාසිතව තිබෙන හදවත් උන්වහන්සේ පෝෂණය කරමින් පිපාසය සන්සිඳවන සේක. මට එය වඩ වඩා අවශ්‍යන තිබෙන්නේය. අවුරුදු ගණනාවක් මම විශ්වාස කළේ අපට බලය ලැබී තිබෙන්නේ සේවය සඳහා පමණක් බවයි. නමුත් දැන් මම දෙවියන් වහන්සේගේ තේජස, දේවරාජ්‍යය සහ අපගේ කාලයේ දී ස්වාමීන් වහන්සේගේ බලය එවන ලෙස යාච්ඤා කරන්නෙමි. එය පැමිණෙන්නේය. මක්නිසාද උන්වහන්සේ එය පොරොන්දු වී තිබෙන බැවින් කිසි දෙයකට එය නතර කිරීමට නුපුළුවන.

සහෝදරයෙනි, අප ඉදිරියේ බොහෝ මහිමාන්විත කාරණා තිබෙන බව මම තහවුර කර සිටින්නෙමි. අපගේ ස්වාමීන් වහන්සේ තෙජසින් වලාකුල් මතට පැමිණීමට පෙර මේ කාලයේදී පෙන්තකොස්තය ආරම්භවීමත් සමඟ පෙන්තකොස්තය අවසන් වන බව මම විශ්වාස කරමි. පීඩාව, සාගතය කඩුව, සහිතව ද්වේශෙ කිරීම් මධ්‍යයේ දේව දරුවන්ව දෙවියන් වහන්සේගේ ආත්මයෙන් පූර්ණ කරමින් උන්වහන්සේගේ මහිමය ප්‍රකාශ වන බව අපි දකින්නෙමු. ලෝකයේ මනුෂ්‍යයන් කිසි දවසක නුදුටු ප්‍රථම වර්ෂාව මෙන් එය දේව දරුවන් වෙත කඩා හැලෙනු ඇත. ඒ දවස පැමිණි විට ශුද්ධාත්මයාණන් දේව දරුවන් වෙත කඩා හැලෙනු ඇත. ඒ දවස පැමිණි විට ශුද්ධාත්මයාණන් වහන්සේව සතුටට පත් නොකළා වූ දේව දරුවන්ට ස්වාමීවූ යේසුස් වහන්සේ ස්වර්ගයට ඔසවාගනු ලැබීමට පෙර දුන්නාවූ පොරොන්දුව හිමිකර ගැනීමට මෙහෙයවන සේක.

කුසගින්නේ සිටින අය වෙතට පමණක් උන්වහන්සේ ස්වර්ගීය මන්නා එවන සේක. පිපාසයක් නොමැති අය මධ්‍යානයේ රස්නය ඇති වෙලාවේ මඟ අසල තිබෙන ළිඳ ළඟට යන්නේවත්, එහිදී උන්වහන්සේව මුණගැසී කථා කරන්නේවත් නැත. ඇදිහිලිවන්තයන් සෑම පැයකදීම සෑම දවසක් පාසා දවසක්ම ශුද්ධාත්මයාණන් වහන්සේ තුළ උන්වහන්සේගේ එළිදරව් කිරීම්, සේවයේ සහ බලයේ අනාවරණය කිරීම් අත්විඳිය යුතුය. ස්වර්ගීය මන්නාවල නැවුම් බව පොළොවෙන් වේගයෙන් නැතිවී යන්නේය. සේවය තුළදී ඊයේ දවසේ කරුණාවේ රසවත්භාවය නැතිවී යාමට පෙර දෙවියන් වහන්සේගේ අත්වල නැවුම්භාවය ලබාගත යුතුය. මනුෂ්‍ය ප්‍රඥාවෙන් සහ මනුෂ්‍ය දැනුමේ වටිනාකම් නොමැතිව දෙවියන් වහන්සේගේ ඉතා හොඳම දේ අත්දකිමින් අවධානම් තත්ත්වයකට මුහුණදීමට අපව කැඳවා ඇති බව මම විශ්වාස කරමි.

යම් කෙනෙක් තමා ප්‍රඥාවන්තයෙක් යැයි සිතනවා නම් ඔහුට වඩා අනුවන කෙනෙක් කෙරෙහි බලාපොරොත්තු විය නොහැකි බව පාවුල්තුමා ප්‍රකාශ කර තිබේ. එමේන්ම පාවුල්තුමා කොරින්තියේ සභාවට ගිය විට සභාවේ සිටියා වූ සෙනඟ අතරේ කිසිවෙක් ක්‍රිස්තුස් වහන්සේගේ මිදීම සහ උන්වහන්සේගේ කුරුස පූජාව පිළිබඳව අවබෝධ කරගෙන නොමැති බව ස්ථිරව තහවුරු කරගත්තේය. අපගේ දේවස්ථාන ගොඩනැගිල්ල සෙනඟගෙන් පිරී තිබෙන අතරමඒ ය හිස්ව තිබිය හැකිය. අපගේ ගීතිකා කණ්ඩායම අලංකාර සංගීතයට අනුව ගායනා කිරීමට පුහුණු වී තිබනෙ අතරම එහි ශබ්දය පිත්තලට හඬනගන්නාක් මෙන් සහ අමිහිරි ශබ්දයක් ඇති කරන්නාක් මෙන් විය හැකිය. අපගේ සිතුවිලි වැඩසටහන් බවට පත්වී, අපගේ සැලසුම්වල කාර්‍යයන් අවසන් නොවී තිබෙන අතරම යේසුස් වහන්සේ උන්වහන්සේගේ අන්තිම රාත්‍රී භෝජනයට පෙර පැවසුවාවූ පොරොන්දුවේ කාර්‍යයන් ඉටු කිරීමට බලය නැතිව සිටිනවා විය හැකිය. මාගේ ආත්මය දැඩි විශ්වාසයෙන් දැල්වීමත් සමඟ එයින් ඈත්වී, රැවටීමට හසුනොවී ස්වාමීන්වහන්සේගේ තේජස ප්‍රකාශ වීම බලා සිටින්නෙමි.

සීමාරහිත හැකියාව

අපි ඇත්තට මුහුණ නොදෙන්නේ ඇයි .. ? අපගේ දේවමෙහෙයේ සහ නමස්කාරයේ පිටත වැස්ම වර්ගීකරණය ඒත්තුගෙන, පිටත වැස්ම සහ යටින් සැඟවී තිබෙන භාහිර සියළු දේ ඉවත්කර දැමීමට ක්‍රියා නොකරන්නේ ඇයි ... ? අපගේ ස්වාමීන් වහන්සේට මොර ගැසීම අවශ්‍යව තිබේ. එම කාරණා ඉටුකරමින් පවතින අතරම උන්වහන්සේ පොරොන්දු වුනාවූ බලය සහ අපට අයිතිව තිබෙන බලය තුළ රැඳී සිටිය යුතුය. යේසුස්වහන්සේ ප්‍රකාශ කළා වූ වචනවලට ඇහුම්කන් දෙන්න. ***"නුඹලා මාගේ නාමයෙන් ඉල්ලන කොයි දෙයක් වුවත් පුත්‍රයා තුළ පියාණන් වහන්සේ මහිමය ලබන පිණිස මම ඒක ඉෂ්ට කරන්නෙමි."*** (යොහාන් 14:13) නැවතත් උන්වහන්සේ මෙසේ පැවසූ සේක. ***"නුඹලා මාගේ නාමයෙන් කොයි දෙයක් ඉල්ලුවත් මම ඒක ඉෂ්ටකරන්නෙමි."*** (යොහාන් 14:14)

ප්‍රේත්‍රුස් සහ යොහාන් එය අනුගමනය කරමින් සුදර්ශන දොරටුව ළඟදී මෙලෙස පැවසුවේය. "ප්‍රේත්‍රුස්ද ... , රන්, රිදී මට නැත. නමුත් මට ඇත් දේ නුඹට දෙමි. නාසරීය යේසුස් වහන්සේගේ නාමයෙන් ඇවිදිපන්නැයි කියා ඔහුගේ දකුණත අල්ලා ඔහු නැගිටෙවුවේය. එකෙනෙහිම ඔහුගේ පාද සහ ඇස්වට සවිවිය." (ක්‍රියා 3:6-7) රෝමවරුන් සිරභාරයට ගනු ලැබුවාවූ මෙම ධීවරයන් රජතුමාව වෙව්ලවීමට සහ අධිරාජ්‍යයාව වෙනස් කිරීමට දේශනා කිරීම සහ සාක්ෂි දැරීම දෙස අවධානයෙන් බලන්න, ඊළඟට අපගේ ව්‍යාජ ලෙස ආරූඪ කරගත් අනුශාසනාවට ඇහුම්කන්දෙන පව්කරුවන්ව දෙවියන් වහන්සේ වෙතට සුළු වශයෙන්වත් හැරෙනවා දැයි බලන්න. ස්වාමීන් වහන්සේ ඔබ තුළ කර තිබෙන්නාවූ සියළු දේ සමඟ ප්‍රිතිවීමට මම අතපසු නොකරමි. නමුත් මම උත්සාහ දරන්නේ දෙවියන් වහන්සේගේ කරුණාව කරුණුකොටගෙන ඔබව ප්‍රබෝධමත් කිරීමටයි. එමනිසා ජීවිතය දෙවියන් වහන්සේගේ ආත්මයෙන් පූර්ණත්වයට ගෙනැවිත් සීමාවක් නැති හැකියාව පාවිච්චි කිරීමට ආරම්භ කරන්න. අපි අතීතය තුළ ජීවත්වීමට අවශ්‍ය නැත.

ඔබ ඉදිරියට යාම අවශ්‍ය වේ.

කානාන් දේශය සෝදිසි කිරීමට ගිය මනුෂ්‍යයන් අතරින් යොෂුවා සහ කාලෙබ් පොරොන්දු දේශයට යාම අන්තරා සහිත කාර්‍යයක් වශයෙන් පෙනුනත් නිර්භීතව සිට ඊශ්‍රායෙල් සෙනඟව ඒ සඳහා පොළඹවනු ලැබුවෝය. ඔවුන් පැමිණෙන විට දෙළුම් සහ මිදි රැගෙන ආවෝය. මිදි පොකුර විශාලව තිබුන නිසා මනුෂ්‍යයන් දෙදෙනෙක් එය උසුලාගෙන ආවෝය. ඉදිරි දවස්වලදී කන්ද එහා පැත්තේ මිටියාවතේ තේජස සෝදිසි කිරීමට උවමනා නැත. වෙන කවදාවත් අත්නුදුටු දෙවියන් වහන්සේගේ අභිමුඛත්වය සහ තේජස විශාල ලෙස අත්දකින පිණිස ශුද්ධාත්මයාණන් වහන්සේ තුළ මම ඉදිරියට ගමන් කරන්නෙමි. අසතුට වැඩිකරන්නාවූකාරණාවන් මොනවා වුවත් අද දවසේ මම සතුටින් (තෘප්තිමත්ව) සිටින්නෙමි. මම මගේ පියාණන් වහන්සේට මොරගසමින් ස්වාමීනී ..., මගේ අතින් අල්ලාගෙන සත්‍යතාවය, බලය, දැනගැන්ම, අවබෝධය, ඇතිව ගමන් කිරීමට මාව යොමු කළ මැනවයි කියන්නෙමි. අපි දෙවියන් වහන්සේට ගෞරව කරමින් උන්වහන්සේට ස්තුති කරන විට අද දවසේ අපගේ අවශ්‍යතාවයන් උන්වහන්සේට ප්‍රකාශ කරන විට උන්වහන්සේ ඒවා සම්පූර්ණ කරනඅ තර අපි වඩ වඩා උන්වහන්සේව දැනගන්නෙමු.

ඔබගේ ජීවිතයේ, ඔබගේ සභාව තුළ ඔබගේ සේවයේ තෘප්තිමත් නොවූ කාරණා දෙවියන් වහන්සේ නැවත පිළියෙල කරන පිණිස මම යාච්ඤා කරමි. මෙම අවුරුදුවල දෙවියන්වහන්සේට ඔබ තුළ කරන්නට වුවමනා කාරණා ශුද්ධාත්මයාණන් වහන්සේ කරුණුකොටගෙන සම්පූර්ණ කළ හැකිය. ඔබව පසුපසට නොව, දෙවියන් වහන්සේ, උන්වහස්ගේ තේජස අපගේ දෑස්වලින් දකින තෙක් අපව ඉදිරියටම මෙහෙයවන (ගෙනයන) සේක. පොරොන්දු වී තිබෙන්නාවූ බලය බලාසිටීම සඳහා යම් කෙනෙක් තමාගේ කැමැත්ත අතහැර යේසුස් වහන්සේව අනුගමනය කරමින් දෙවියන් වහන්සේ සමඟ ඉදිරියටම යා යුතුය. එම පොරොන්දුව දෙවියන් වහන්සේ සම්පූර්ණ කරන සේක.

ස්වාමීන් වහන්සේගේ ආශිර්වාදලත් සත්‍යතාවය විදහාපාන්නේ හෝ මනුෂ්‍යත්වගේ නිශ්ඵල වචන තුළ වෙහෙයසීමේ, වීර්‍යකිරීමේ ලකත්ෂණ දක්වන්නේ කෙසේද ...? ඔබගේ සෙවියේ දී ඔබ දේශනා කරන්නා වූ පණිවිඩය කරුණුකොටගෙන හදවත තුළ දැඩි උද්යෝගයෙන් දැල්වීමට ප්‍රකාශ වන බව ඔබගේ දේශනවා අසා සිටින්නාවූ අයට හැගෙන්නේ නැද්ද ... ? ශුද්ධාත්මයාණන් වහන්සේගේ අභිමුඛත්වය සහ අද දවසේ

8 පිටුවට

"ස්වාමීන් වහන්ස ..... අවුරුදු අතරතුරේ ඔබගේ ක්‍රියාකිරීම් ප්‍රාණවත් කළ මැනව .... " (හබක්කුක් 3:2)

2 පිටුවෙන්

දෙවියන් වහන්සේගේ ...

පෙනුණෝය. එවිට විනිශ්චය දේවගෘහයේ සිට ආරම්භවේ (ලූක් 21:34-36, 1 ප්‍රේත්‍රුස් 4:17)

නොඇදහිලිකාර ලෝකයේ එල පහසුවෙන් සහාවේ හටගන්නේය

මක්නිසාද ලෝකය තුළ තිබෙන විනාශය පහසුවේන්ම සියොන් තුළද පවතින්නේය. එබැවින් දෙවියන් වහන්සේගේ සෙනඟ උන්වහන්සේගේ සාක්ෂිකාරයන් වෙනවා වෙනුවට කලහකාරීව කටයුතු කරනු ලබන්නේය. සහාව තමන්ගේ ආකෘතිය ක්‍රමක්‍රමයෙන් වෙනස් කරගෙන ලෝකයේ ද්‍රෝහිකාරකම්වලට හැරෙන්නේය. සහාව ක්‍රමක්‍රමයෙන් නොඇදහිලිකාර ලෝකයේ ස්වභාවයන් සෑමවිටම නිරූපනය කරනු ලබමින් සිටති.

කලටත් අකලටත් වැඩේ යෙදී සිටින්නැයි ආඥා කරමින් දෙවියන් වහන්සේ අවධාරණය කර තියෙන්නෙ කුමක්ද .. ? ස්වාමීන්වහන්සේ තුළ ශක්තිමත්ව සිටින පිණිස දෙවියන් වහන්සේගේ යුධායුධ පැළඳගන්න. පොරබැදීමට, සිංහයන්ගේ කටවල් බැඳීමට සතුරාගේ ගිනිහෙල්ල නිවීමට, ආත්මයාණන් වහන්සේ තුළ නොකඩවා යාච්ඤා කරන්න. උද්යෝගයෙන් යුතුව සියළු දේව දරුවන් උදෙසාත් නොකඩවා යාච්ඤා කරන්න. (පීස 6:10-20)

ඔබගේ ඇල්මැරුණාවූ ක්‍රියාමාර්ග අත්හැර දමන්න.

"ඒ වනාහී තමාගේ දාසයන්ට බලය ද, එකිනෙකාට තම තමාගේ වැඩද, දී අවදිව සිටින්නැයි දොරටු පාලකයාට අණදී තමාගේ ගෙදරින් පිටත්ව ගොස් අන් රටක නැවතී සිටින මනුෂ්‍යයෙකුට සමානය " (මාර්ක් 13:34)

"උන්වහන්සේ ඔවුන්ට කියන සේක් නුඹලා ලොව පුළුල්ලේ ගොස් සකල ජනාවට සුභාරංචිය ප්‍රකාශ කරපල්ලා" (මාර්ක් 16:15) බලවත් වූ දෙවියන් වහන්සේගේ ආඥාවලට අපගේ අකීකරුවීම් ගැන සහ සුභාරංචියේ කාර්‍යයන් ඵලදායී සහ උද්යෝගයෙන් නොකිරීම ගැන අප තුළ දෝෂාරෝපණය තිබෙනවා නම් අපගේ හදවතින් යටහත් කරගන්නේ නැතිව උන්වහන්සේ ඉදිරියේ අපගේ හදවත් වලින් පසුතැවිලි නොවී අපගේ ආත්මික ඇල්මැරුණු ස්වභාවයන් ගැන සමාව අයැද සිටින්නේ නැතිව ජයග්‍රහණය ලැබීමට නුපුළුවන. අපගේ ඇල්මැරුණු ස්වභාවයන් අත්හැරදමා දෙවියන් වහන්සේගේ කරුණාව උදෙසා යාච්ඤා කරමු.

අපි අපගේ ඇල්මැරුණු ස්වභාවයන් ගැන හෝ වෙනත් කිසියම් පාපයක් පිළිබඳව නිදහසට කරුණු පෙන්වා දෙමින් සිටින්නේ නම් සහ පාපය සඟවාගන්නේ නම් සළුලත්වය ලැබීමට නුපුළුවන. (හිතෝපදේශ 28 : 13 යොහාන් 1:9) නමුත් අපි අපගේ ජීවිත දෙවියන් වහන්සේගේ බලවත් හස්තයකට යටත්කර දෙමින් ප්‍රතමයෙන් දේවරාජ්‍යය සහ ධර්මිෂ්ඨකම නොසෙවීම පිළිබඳව පසුතැවිලි වන්නේ නම්, උද්යෝගිමත් නොවූ ඇල්මැරුණාවූ ස්වභාවයන් වලින් ආත්මික ජයග්‍රහණය ලැබීමට අනවශ්‍ය ශක්තිය දෙවියන් වහන්සේ ලබා දෙන සේක. දෙවියන් වහන්සේගේ කරුණාව සහ උපකාරය අපි අත්දකින්නෙමු. (මතෙවි 3:33 යෙරමියා 29:1, හෙබ්‍රෙව් 4:14-16) මේ අන්තිම හෝරාවේදී දෙවියන් වහ්සේගේ විනිශ්චයේ කුණාටුව පැමිණීමට පෙර මහත් වූ ආත්ම පරිත්‍යාගයකින් යුතුව, වික්‍රමාන්විතව ක්‍රියාකිරීම අත්‍යවශ්‍යය වන්නේය.

සාක්ෂි දැරීමට සහ අස්වැන්න නෙළීමේ කාර්‍යයය සඳහා පිඹිදෙන්න. උදෑසනින්ම අවදිවී දවසේ උණුසුම තුළ සහ වෙහෙසවීම තුළ ප්‍රීතියෙන් වැඩකරන්න. සහා කාලයේ දි සීමාවක් නැතුව ගැළවුම්කරුවාණන්ගේ නාමයට අස්වැන්න නෙළා ගැනීමට ගැඹුරු සුභාරංචි සේවයක් අත්‍යාවශ්‍යව තිබේ. දෙවියන් වහන්සේගේ සත්‍යතාවයට ඔබගේ මුළු ජීවිතයම විවෘත කරන්න. ක්‍රිස්තුස් වහන්සේ උදෙසා දුක්විඳීමටත්, සුභාරංචි සේවය උදෙසාත් ඔබගේ මුළු ජීවිතයම පූජාකර (කැපකර) තිබෙනවාදැයි ඔබගෙන්ම අසන්න. නිශ්චලභාවයක් උදෙසා නොව ඵලදායී සේවයක් උදෙසා ජීවමාන යාගයක් ලෙස පූජාවීම දෙවියන් වහන්සේ ඉල්ලා සිටින සේක. උන්වහන්සේගේ වචනය පැහැදිලිව තිබෙන සේක. අපගේ මුළු හදවතින් මුළු ආත්මයෙන්, මුළු ශක්තියෙන්, මුළු බුද්ධියෙන් දෙවියන් වහන්සේට ප්‍රේම කරමින් උන්වහන්සේගේ මහත් වූ කාර්‍යය ඉටුකරන පිණිස මේ මොහොතේ සිට අවසානය දක්වා අපව යොදවා ගැනීමට උන්වහන්සේ බලා සිටින සේක. සෑම කෙනෙකුටම සුභාරංචිය ප්‍රකාශ කළ යුතුය. (රෝම 12:1, මතෙවි 22:36-39)

ස්වාමීනී..., මාගේ ජීවිතය ජීවමාන යාගයක් කර පූජාකරනවා වෙනුවට මට උවමනාදේ කිරීම ගැන මට සමාවුව මැනව කියා උනන්දුවෙන් යාච්ඤා කරන්න. ස්වාමීනී..., ඔබගේ මාර්ගයේ කුඩා කාරණක් ගැන හෝ මම අසාර්ථක වූවා නම් මට කමාවුව මැනව. ඔබවහන්සේගේ දෑතේ මාව නිර්මාණය කළ මැනව. ඵල රහිත සහ පාපිෂ්ඨ වූ මාගේ ජීවිතය ඔබගේ ආත්මයෙන් පූර්ණ කළ මැනව. දවස් නපුරු බැවින් ප්‍රස්ථාව (අපේ මිදීම) තදින් අල්ලා ගන්නා ලෙස දෙවියන් වහන්සේ ආඥා කළ සේක. (එපීස 5:16) ස්වාමීන් වහන්සේ එන තෙක් අපට බාරදී තිබෙන්නාවූ කාර්‍යයේ යෙදි සිටීමට උන්වහන්සේ ආඥාකර තිබෙන සේක. (ලූක් 19:13) ක්‍රිස්තුස් වහන්සේගේ විනිශ්චාසනය ඉදිරියේ අප සිටින විට අප ආශිර්වාද ලද් දන්වීමට අපගේ කාලය, ශක්තිය, මුදල්, දක්ෂතාවයන් දෙවියන් වහන්සේගේ රාජ්‍යයත්, උන්වහන්සේගේ ධර්මිෂ්ඨකමත් සෙවීමට යොදවමු. එබඳු වූ අයට දේව වචනයේ මෙසේ පවසා තිබෙන සේක. ***"ඔහුගේ ස්වාමියා ඔහුට කථාකොට, යහපත් වූ , විශ්වාස වූ දාසය ඒ යහපත ස්වල්ප දේ, ගැන නුඹ විශ්වාසවූවෙහිය. බොහෝ දේ, කෙරෙහි නුඹ අධිපති කරමි. නුඹේ ස්වාමියාගේ ප්‍රීතියට ඇතුල් වෙයන්නැයි ඔහුට කීවේය."*** (මතෙවි 25:21)

---

3 පිටුවෙන්

මනුෂ්‍යයන් යාච්ඤා...

දුන්නේය. ඉතා පුදුම සහගත ලෙස තුන්සියයක් මනුෂ්‍යයන් ක්‍රිස්තුස් වහන්සේට පළමු වරට ජීවිතය භාරදීමට සිටගත්තෝය.

ඩී.එල්. මුඩි තමා කියූ දේ ඔවුන්ට වැටහුනේ නැතියි සිතා ඔවුන්ට වාඩි වෙන්නැයි කියා නැවතත් පළමු ප්‍රකාශයම කළේය. දෙවෙනි අවස්ථාවේදී ද එලෙසම මනුෂ්‍යයන් විශාල පිරිසක් සිටගත්තෝය. මැදහත්කාරකමින් ඔත්පලව සිටියා වූ ශුද්ධවන්තයන් හදවත් ඉරාගෙන දෙවියන් වහන්සේගේ පාමුල වැටුණෝය. ඒ අවස්ථාවේ සිට ඩී.එල්. මුඩි සේවය කිරීම සඳහා සිටගත්තේ කොතැනද පිඹිදීමේ ආත්මය ඒ සියළු ස්ථානවල වැගිරී ගියේය. දහස් ගණන් බ්‍රිතාන්‍ය දූපත්වල මනුෂ්‍යයන් ගැලවීමට පැමිණියේය. දුර්වලවී තිබුණු මධ්‍යම බටහිර ප්‍රදේශයේ ජන සමාජයන් සහ නගරවල පිඹිදීම වෙනුවෙන් දවස්පතා යාච්ඤා කිරීමෙන් සිදුවුනාවූ සිදුවීම් පිළිබඳව යම් කෙනෙක් ලියා තිබුණා වූ කාරණා මම ඔබට ප්‍රකාශ කරමි.

පිඹිදීම උදෙසා ඇදහිල්ලේ යාච්ඤාවේ යෙදී සිටීමට මට හැකියාව ලබා දුන් සේක. යනුවෙන් ඔහුගේ දින පොතේ ප්‍රදේශ (ස්ථාන) තිහක් ගැන නැවත නැවත හැම දවසකම සටහන් කර තිබුණි. ඔහුගේ මරණයෙන් පසුව ඔහු තම දින පොතේ සටහන් කර තිබූ ස්ථාන තිහ කරා පිඹිදීම ගලා ආ බව දිනපොත ගැන කියවන්නන්ට දකින්නට ලැබුණි. දෙවියන් වහන්සේගේ ගබඩාවේ දොරටු විවෘත කිරීමේ යතුර ඇදහිල්ලේ යාච්ඤාවේ යෙදී සිටීමයි.

අතීතයේ දී මෙතෝදිස්ත සභාව මගින් පිලි නැමති නරගයට දේශකයෙකුට පසුව දේශකයෙකුව යවනු ලැබීය. මෙම නගරය ඉතා තදින් සාතන්ගේ ග්‍රහණයට හසුවී තිබුණි. දේශකයෙකුට පසු දේශකයෙක් උත්සාහයෙන් යුතුව කටයුතු කළත් බලාපොරොත්තුවක් නොමැති නිසා එම ස්ථානය අතහැර දමනු ලැබුවෝය. ඉතා දැඩි ලෙස අවශ්‍යව තිබූ පීලී නගරයේ උවමනාවන් පිළිබඳව ජෝන් ඔක්ස්ටොබේට අසන්නට ලැබුණි. මෙතෝදිස්ත සම්මන්ත්‍රණයකදී ජෝන් ඔක්ස්ටොබේ, මාව පීලි නගරයට යවන්න. දෙවියන් වහන්සේ උන්වහන්සේගේ ක්‍රියා කිරීම කරුණුකොටගෙන පීලි නගරය පුබුදුවන්නට යන සේක කියා සහතික ලෙස ප්‍රකාශ කළේය. සම්මන්ත්‍රණයේ දී ඒ සඳහා කැමැත්ත පලකරනු ලැබූ නිසා ජෝන් තමන්ගේ මිෂනාරි සේවය සඳහා පිටත්ව යාමට සූදානම් විය. පීලි නගරය පිපිරී යනවා ජෝන් දුටුවේය. ඔහු මෙම අවධානම පිළිබඳව දැඩි වේදනාවකින් යුතුව දණින් වැටී පොර බඳමින් සහ කඳුලු සලමින් මනුෂ්‍යයන්ගේ ආත්ම උදෙසා යාච්ඤා කළේය. පැය ගණන් ඔහු මොරගැසුවේය. බොහෝ වේලාවක් නොකඩවා යාච්ඤාවෙන් පොර බඳමින් සිටිද්දී ජෝන් ඔක්ටොබේට දෙවියන් වහන්සේගේ තේජස ඔහුගේ මුළු ශරීරය පුරාම ගලායනවා දැණුනේය. එවිට ඔහු දණින් වැටී සිටීමෙන් නැගිට "පීලී දිනාගන්න...., පීලී දිනාගන්න.." කියා කෑගැසුවේය.

ඉන් අනතුරුව පීලී නගරයේ සිටි සියළුදෙනාව ක්‍රිස්තුස් වහන්සේ වෙතට දිනාගනු ලැබීය. කරුණාවේ සිංහාසනයේ සිට උද්යෝගය පැමිණියේය. ඔහු එම නගරයට ඇතුල් වූ විට දෙවියන් වහන්සේ වෙතට හැරී ගැලවීම අත්දකින්න කියා වීදි දිගේ ගායනා කිරීමට පටන් ගත්තේය. ශක්තිමත් ධීවරයන් කණ්ඩායමක් එයට ඇහුම්කන්දීගෙන සිටියේය. අසාමාන්‍ය බලයකින් කළ ඔහුගේ කථාවට ද අවධානය යොමු කරනු ලැබීය. දරුණු පව්කරුවන් වූ අය අඬන්නටත්, ශක්තිමත් මනුෂ්‍යයන් වෙව්ලන්නටත්, වූ අතර ඔහු යාච්ඤා කරද්දී ධීවරයන් කණ්ඩායම දණින් වැටී දෙවියන් වහන්සේගේ කරුණාව ලබා දෙන්නැයි මහත් ශබ්දයකින් මොරගැසුවෝය.

අපි යාච්ඤා කරන්නේ නම් පිඹිදීම ගෙන ඒමට පුළුවන. අපි යාච්ඤා නොකර සිටින්නේ නම් දෙවියන් වහන්සේ ඉදිරියේ අපට ඇති නිදහසට කරුණ කුමක්ද .. ? බිඳ වැටුණු ජන වර්ගයන් වෙත දෙවියන් වහන්සේග් කරුණා ව වගුරන විට උන්වහන්සේගේ මහත් වූ සැලැස්ම නැවත ඉටුවනු ඇතැයි කියා ද, දෙවියන් වහන්සේ උන්වහන්සේගේ සැලැස්ම තුළ මැදහත්කම් කිරීම ඇතුළත් කර තිබෙන බවත්. මැදහත්කාරකම් කිරීම මත විශාල ලෙස රැඳී සිටීම සහ දිව්‍යමය ක්‍රියාව ගෞරවණීයව බලා සිටීම අවශ්‍ය බවත් පැවසීමට මට ඉඩදෙන්න කියා ඩබ්.ජී. බෙන්ට් ලියා තිබූ ප්‍රකාශය ඉටුවෙනවා මම දුටුවෙමි.

යාච්ඤා කිරීමෙහි පවතින විට පමණක් සහාවට අස්වැන්න නෙළීමට මෙහෙකරුවන් එවීමට දෙවියන් වහන්සේ බලා සිටින සේක. (ලූක් 10:2) ක්‍රිස්තුස් වහන්සේගේ කුරුසපත්වීමට පෙර අන්තිම රාත්‍රී භෝජනයේ දී උන්වහන්සේගේ ගෝලයන් සමඟ ප්‍රකාශ කළා වූ වචන වලදී අනාගතයේ උන්වහන්සේගේ සභාවට පැමිණෙන්නාවූ සැනසිලිදායක උත්තමයාණන් වහන්සේගේ ක්‍රියාකිරීම, උන්වහන්සේගේ සභාවේ යාච්ඤා කිරීම මත රැඳී පවතින බව ප්‍රකාශ කළ සේක. මෙම සියළුම කාරණාවලින් තහවුරුවන්නේ දෙවියන් වහන්සේගේ සෙනඟ යාච්ඤා කරන විට දෙවියන් වහන්සේ මහත් ලෙස ක්‍රියා කරන්නේය යනුයි.

"එබැවින් ස්වාමීන් වහන්සේ ඒ දවසේදී සඳහන් කළ මේ කන්ද මට දුන මැනවි" (යොෂුවා 14:12)

ආත්මික මනුෂ්‍යයෙකුගේ ලක්ෂණ

ඒ. ඩබ්. ටෝසර් විසිනි

විවිධ වූ කිතුණු කණ්ඩායම් අතර වෙනස්, වෙනස් සංකල්පයන් පවතියි. සමහර කණ්ඩායම් යම් පුද්ගලයෙක් ප්‍රකාශ කරන්නා වූ ආගමික වචන ඉතා ඉහළ ආත්මික සිතුවිලි ලෙස සලකුණ ලබති. තවත් සමහරු සෝෂාකාරී බව ආත්මික ලක්ෂණයක් ලෙස අතිශය උද්යෝගයෙන් පිළිගනිති. සමහර සභාවල යම් පුද්ගලයන් ශබ්ද නගා දීර්ඝ ලෙස යාච්ඤා කරමින් සෙනඟ අතරේ ඉතා ආත්මික පුද්ගලයෙක් ලෙස හොඳ නමක් දිනා ගැනීමට උත්සාහ කරති. දැන් නිරන්තරයෙන් සිදුවෙන්නාවූ යාච්ඤා කිරීම් සහ ශබ්ද නගා ප්‍රශංසා කිරීම්වලදී සියල්ලම නොකඩවා පවතින ආත්මිකව විවිධාකාරයෙන් වූ සාක්ෂි දෙස අවධානය යොමු කරමු. එසේ අවධානය යොමු කිරීමෙන් ඉතා වැදගත් ලෙස අපි අවබෝධ කරගත යුතු වන්නේ ඔවුන් තමන්ගේ ජීවිත (තමන්වම) පමුණුවා ගැනීමට ක්‍රියා නොකරන බවයි. සැබෑ ආත්මික බව ප්‍රකාශවීම තුළ එහි විශේෂ ලක්ෂණ ස්තීරවම කැපී පෙනීම ඕනෑකරන්නේය. මෙහිදී අවශ්‍ය තරම් ප්‍රමාණත් වූ, සැමදාම පවතින්නාවූ, ගැඹුරින් පිහිටුවන ලද බලයෙන් පූර්ණ වූ සහ හික්මවීමේ ජීවිතයකට පොළඹවනු ලබන්නේය.

(1) ප්‍රථමයෙන්ම ප්‍රීතියට වඩා වැඩියෙන් ශුද්ධකම අවශ්‍ය වන්නේය.

කිතුණුවන් අතරේ බොහෝ දෙනා දැඩි ලෙස ආශා කරන ප්‍රීතිමත්කම සොයා යන නිසා උත්කෘෂ්ඨ තත්ත්වයේ ශුද්ධකමක් ප්‍රකාශ කරන නමුත් ඇත්තටම එවැනි ශුද්ධකමක් ප්‍රකාශවීම පිළිබඳව ප්‍රමානවත් ලෙස තහවුරු වන්නේ නැත. දෙවියන් වහන්සේ නියමිත වෙලාවට ප්‍රීතිය මහත් ලෙස ලබා දෙන බව සැබෑ ආත්මික මනුෂ්‍යයා දන්නා බැවින් ඔහුට තමාගේ ආත්මයට හානියක් නොවී එය ලබා ගැනීමට හැකි වනඅ තර ඔහු එය හිටි ගමන් ඉල්ලා සිටින්නේ නැත. අතීතයේ මෙතෝදිස්ත සභාවේ සිටි සාමාජිකයන්ට ජොන් වෙස්ලි මෙලෙස පැවසුවේය. "මනුෂ්‍යයන් ශුද්ධකමට පැමිණෙන්නේ කෙසේදැයි ඉගෙන ගන්නවා වෙනුවට ආගමික ප්‍රීතිය උදෙසා සභාවට පැමිණීම නිසා ඔවුන් ප්‍රේමය තුළ සම්පූර්ණ ලෙස ගොඩනැගීම සිදුවේ යැයි විශ්වාස කළ නොහැකිය. "

(2) ආත්මික මනුෂ්‍යයෙකුගේ කරුණු සලකා බලන විට ඔහු තමාගේ ජීවිතයෙන් දෙවියන් වහන්සේට ගෞරවය ලබාදීම වර්ධනය කර ගැනීමට අවශ්‍යතාවය ඇතිව බලාසිටින්නේය.

එයින් අදහස් කරන්නේ ඔහු තමා මුහුණ දෙන තාවකාලික දුක්විඳීම්වලදී උන්වහන්සේ සමඟ ඇති ගිවිසුම් ප්‍රතික්ෂේප කරන්නේ හෝ අත්හැර දමන්නේ නැත. එවැනි මනුෂ්‍යයෙකුගේ යාච්ඤා කිරීම මෙසේ වන්නේය. දෙවියන් වහන්සේගේ නාමය පාරිශුද්ධය එමෙන්ම උන්වහන්සේගේ නාමය උසස්කරන පිණිස මට කුමක් වුවත් කමක් නැහැ. මම නිශ්චලව සිටින්නෙමි. ඔහුගේ ජීවිතයේ ආත්මික ස්වභාවය ප්‍රකාශවීම කරුණුකොටගෙන දෙවියන් වහන්සේව ගෞරවයට පත්කිරීම උදෙසා ජීවත්වන්නේය. සෑමවිටම ඔහුගේ ජීවිතයේ සියළුම තෝරා ගැනීම් දේව මහිමය උදෙසා වන්නේය. එබඳු පුද්ගලයින්ගේ හදවත් තුළ ඇති කාරණා පිළිබඳව දෙවියන් වහන්සේට විවාද කිරීමට අවශ්‍ය වන්නේ නැති නිසා එහිදී විවාදයක් හට ගන්නේ නැත. ඔහුට අවශ්‍යවන්නේ දෙවියන් වහන්සේට මහිමය ලබාදීමයි. මනුෂ්‍යයෙකුට හුස්ම ගැනීමට වාතය අවශ්‍යව තිබෙන්නාක් මෙන් ඔහුට දෙවියන් වහන්සේව මහිමයට පත්කිරීමට දැඩි සේ වුවමනා වන්නේය.

(3) ආත්මික මුනෂ්‍යයාට ඔහුගේ කුරුසිය උසුලාගෙන යාමට අවශ්‍ය වන්නේය.

බොහෝ කිතුණුවන් දුෂ්කතරතාවයන් හෝ පීඩාවන් සුසුම්ලෑමෙන් යුතුව බාරගන්නා අතර එය තමන්ගේ කුරුසිය බව පවසන්නෝය. ශුද්ධවන්තයන් සහ පව්කාරයන් යන දෙගොල්ලන්ටම ඒකාකාරව එවැනි කාරණාවාලට මුහුණදීමට සිදුවන බව ඔවුන් අමතක කරනු ලබන්නෝය. කුරුසිය උසුලාගෙන යාම යනු අපට පැමිණෙන්නාවූ දුෂ්කරතාවයන් වලට (අපාදවාලට) අමතරව ක්‍රිස්තුස් වහන්ස්ට කීකරුවීමේ ප්‍රතිඵලය ලෙස පැමිණෙන්නාවූ කාරණාවන් වන්නේය. මෙම කුරුසිය අප මත බලහත්කාරයෙන් පවරන්නේ නැත. අපි එහි ප්‍රතිඵලය සම්පූර්ණයෙන්ම අවබෝධ කරගෙන ස්ව කැමැත්තෙන්ම එය දරාගෙන යා යුතුය. අපි ක්‍රිස්තුස් වහන්සේට කීකරුවීම සහ කුරුසිය උසුලාගෙන යාම තෝරාගත යුතුය. කුරුසිය උසුලාගෙන යාමෙන් අදහස් කරනු ලබන්නේ ක්‍රිස්තුස් වහන්සේගේ පුද්ගලිකත්වයට බැඳී සිටීම, ක්‍රිස්තුස් වහන්සේගේ ස්වාමීත්වයට කැපවීම සහ ක්‍රිස්තුස් වහන්සේගේ ආඥාවන්ට කීකරුවීම වන්නේය. ක්‍රිස්තුස් වහන්සේගේ පුද්ගලිකත්වයට සම්බන්ධවී සිටීම නිසා උන්වහන්සේගේ ස්වාමීත්වයට කැපවී සිටින නිසා සහ උන්වහන්සේගේ ආඥාවන්ට කීකරුවන නිසා එබඳු පුද්ගලයා ආත්මික මනුෂ්‍යයෙකි.

(4) කිතුණුවන් ආත්මික පුද්ගලයන් වන විට ඔවුන් සියළුමදේ දෙවියන් වහන්සේ දකින ආකාරයෙන් දිකිනු ලබනවා ඇත. සියළු දේවල වටිනාකම දිව්‍යමය පරිමාණයට අනුව මැනීමටත්, ආත්මයෙන් පූර්ණ වූ ජීවිතයක් ඇති දෙවියන් වහන්සේ ක්‍රියා කරන්නාවූ ආකාරය මෙන් සෑම ස්ථානයකටම වැදගත්කම දැක්වීමටත් ඔවුන්ට හැකියාව ලැබෙන්නේය.

එම අවස්ථාවේදීම දෙවියන් වහන්සේ බලන ආකාරයෙන් කටයුතු කරනු ලබන්නේය. ඔහුගේ බලාසිටීම විවේක ගැනීම උදෙසා නොව නමුත් කාරණාවල සැබෑ අදහස අවබෝධ කර ගැනීම වන්නේය. ලෞකික කිතුණුවන් වස්තුව සහ වාතාවරණය දෙස බලන නමුත් උද්යෝගයෙන් දැකීමට හෝ දකින්නාවූ දේවල් පසෙක දැමීමට කටයුතු කරන්නේ නැත. ආත්මික මනුෂ්‍යයා දෙවියන් වහන්සේ සිතන ආකාරයෙන් සහ උන්වහන්සේ බලන ආකාරයෙන් දැකීමටත්, සිතීමටත් හැකියාව ඇතිව සිටිති. එමෙන්ම ආත්මික මනුෂ්‍යයා දෙවියන් වහන්සේ දකින ආකාරයෙන් දැකීමට තමාගේ ජීවිතය යටත්කර දෙනු ලබන අතර තමන් නොදන්නාවූ රහස් කාරණා පිළිබඳව සැබෑ ලෙස වේදනාවට පත්වන්නේය.

(5) ආත්මික මනුෂ්‍යයා වැරදි ආකාරයෙන් ජීවත්වීමට වඩා වැඩියෙන් හරිදේ කිරීමට ආශාවන්නේය.

තමාගේ ජීවිතය පිළිබඳව කැළඹීමට ලක්නොවී සිටීම දෙවියන් වහන්සේගේ මනුෂ්‍යයෙකු තුළ ඇති තවත් ලක්ෂණයකි. ලෝකයට ඉතා ඇලුම් කරන්නාවූ, වස්තුව පිළිබඳව ඉතා දැඩි ලෙස අවධානය යොමු කරන්නාවූ කිතුණුවන්ගේ හදවත් තුළ ඇති අසංවේදීතාවය නිසා මරණය පිළිබඳව දැඩි බියකින් බලා සිටින්නෝය. නමුත් ඔහු ආත්මයාණන් වහන්සේ තුළ ජීවත්වීමට යොමුවෙද්දී දයාවෙන් යුතුව ජීවත්වීම වර්ධනය වන්නේය. ඔහු ජීවිතයට දවස් කිහිපයක් අල්ලාගෙන එකතුකර ගැනීමට අසාර්ථකවීම් හෝ එකඟතාවයන් වැය කරන්නේ නැත. අපි සියළුදෙනාම නිවැරදි දේ කිරීම සහ ජීවිතයේ ආශාවන් ප්‍රීතියෙන් දෙවියන් වහන්සේට භාරදෙන්නේ කෙසේදැයි දැන ගැනීම දෙවියන් වහන්සේට අවශ්‍යව තිබෙන සේක. එබඳු පුද්ගලයන් මරණය දරා ගැනීමට පුළුවන් බව දැන සිටින්නෝය. දැන් ඔහු ක්‍රිස්තුස් වහන්සේ තුළ සිටින නිසා වැරදි දේ කිරීම මත රැඳී සිටීමට නුපුළුවන් බව දැන සිටින්නේය. එම දැන ගැන්ම ඔහුගේ සිතුවිලි සහ ක්‍රියාවන් කෙබඳු දැයි තහවුරු කරනු ලබන්නෝය.

(6) අනිත් අයගේ දියුණුව දැකීමට, වැයවීමට ආශාවීම ආත්මික මනුෂ්‍යයෙකුගේ තවත් ලක්ෂණයකි.

අනික් අයගේ දියුණුව, අනික් කිතුණුවන් තමන්ට වඩා උසස් වනු දැකීම, ඔවුන් උසස් වෙද්දී ප්‍රීතිවීම සහ තමන් ඔවුන්ට වඩා ඉහළින් සිටීමට උත්සාහ නොදැරීම ආත්මික මනුෂ්‍යයාගේ අවශ්‍යතාවය වන්නේය. එහිදී ඔහුගේ හදවතේ ඊර්ෂ්‍යාවක් හටගන්නේ නැත. සහෝදරයන් ගෞරව ලබන විට සතුටුවන්නේය. මක්නිසාද එය දෙවියන් වහන්සේගේ කැමැත්ත තිබෙන සේක. ස්වර්ගයේ මෙන් පොළොවේද දෙවියන් වහන්සේගේ කැමැත්ත ඉටුවීම ඔහුගේ ආශාව වේ. දෙවියන් වහන්සේ කැමති වන්නාවූ කාරණයට ආත්මික මනුෂ්‍යයාද කැමති වන විට සහ ඔහු උන්වහන්සේව ප්‍රසන්න කරන විට දෙවියන් වහන්සේ ඔහුව තවත් උසස් කරන සේක.

(7) කාලයේ විනිශ්චයන් වෙනුවට ආත්මික මනුෂ්‍යයා සදාකාලික විනිශ්චයට පුරුදුවන්නේය.

ඔහු ඇදහිල්ල කරුණුකොටගෙන ලෝකයේ දේවලට ඉහළින් සිටීමට තදින් යොමුවීමටත්, කාලයේ ගලායාමට සහ මේ වන විටත් මේ ලෝකය අතහැර ගණන් කළ නොහැකි ස්වර්ගීය සේනාවන් සමඟ සම්බන්ධවීමට ගියාවූ අයට හැගෙන්නාවූ ආකාරය ඉගෙන ගැනීමටත් ප්‍රසිද්ධවීමට වඩා දෙවියන් වහන්සේ පාවිච්චි කරන පුද්ගලයෙක් වීමටත්, සේවය ලැබීමට නොව සේවය කිරීමටෙත් ඇළුම් වන්නේය. ඔහු තුළ වාසය කරන්නා වූ ශුද්ධාත්මයාණන් වහන්සේ කරුණුකොටගෙන මේ සියළු දේවල් ක්‍රියාත්මක වන්නේය. තමාගේ හැකියාවෙන් කිසිම පුද්ගලයෙකුට ආත්මික මනුෂ්‍යයෙක් විය නොහැකිය. ආත්මයාණන් වහන්සේට ක්‍රියා කිරීමට ඉඩ ලබාදීමෙන් පමණක් ආත්මික මනුෂ්‍යයෙකු ලෙස ගොඩනැගීමට හැකිවේ.

Reg. No: QD/111/පුවත්/2021
30/7,A චාල්ස් පෙදෙස, රාවතාවත්ත, මොරටුව.

5 පිටුවෙන්

ශුද්ධාත්මයෙන් පූර්ණවීමට

උන්වහන්සේගේ උපකාරය නිසා උන්වහන්සේට ස්තුති වේවා. මෙම සත්‍යතාවය ප්‍රකාශ කිරීමට අපගේ හදවත් විවෘත කරන ලෙස උන්වහන්සේට යාච්ඤා කරමු. ***"මේ නිසා මමත් ස්වාමී වූ යේසුස් වහන්සේ තුළ නුඹලා අතරේ ඇත්තාවූ නුඹලා සියළු ශුද්ධවන්තයන්ට දක්වන්නාවූ ඇදහිල්ල ගැන අසා නුඹලා මාගේ යාච්ඤාවලදී සඳහන් කරමින් නුඹලා ගැන නොකඩවා ස්තුති කරමි. එසේ කරන්නේ මහිමයේ පියාණන් වහන්සේ වන අපගේ ස්වාමී වූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ දෙවියන් වන්සේ, උන්වහන්සේ ගැන දැන ගැනීමට ප්‍රඥාවේද, එළිදරව් කිරීමේද, ආත්මයක් නුඹලාට දෙන ලෙසත්, උන්වහන්සේගේ කැඳවීමේ බලාපොරොත්තුව කිමකේද, කියාත් ශුද්ධවන්තයන් තුළ වූ උන්වහන්සේගේ උරුමයේ මහිමයේ සම්පත කිමෙක්ද, කියාත්., අදහන්නාවූ අප කෙරෙහි උන්වහන්සේගේ බලයේ මහත්කම කිමෙක්ද, කියාත්, නුඹලා දැනගන්න පිණිස නුඹලාගේ සිත් නැමති ඇස් පහදන ලෙසත්ය."*** (එපීස 1:15-19) අපගේ පියවූ තේජසේ දෙවියන් වහන්සේ ප්‍රඥාවේ සහ එළිදරව් කිරීමේ ආත්මයක් අපට ලබාදෙන සේක. පුත්‍රයාණන් වහන්සේගේ මහිමය උදෙසා ශුද්ධාත්මයාණන් වහන්සේගේ පරිපාලනය යටතේ උන්වහන්සේ එය අපට ලබාදෙන සේක. සැමදාම අපි කරුණාව සහ දැනගැන්ම තුළ වර්ධනය වන්නෙමු. ලියා තිබෙන්නාවූ වචනය ජීවමනාය. සැගවී තිබෙන්නාවූ රහස දිව්‍යමය එළිදරව් කිරීම තුළින් පමණක් අවබෝධ කර ගැනීමට සහ ආලෝකකර ගැනීමට හැකිවන්නේය. ඊළඟට ශුද්ධ ලියවිල්ලේ සඳහන් පරිදි සිත් නැමති ඇස් විවෘත වී අපි මෙම කාරණා දකින්නෙමු.

මෙම දැනගැන්ම ආත්මික දැනගැන්මයි. එය අවබෝධ කර ගැනීමට වෙනත් දැනගැන්මක් නොමැත. ඔබට එය මගෙන් ලබාගත නොහැකිය. ඔබ දෙවියන් වහන්සේ වෙතට යා යුතුය. තවත් දේශකයෙක්ට සවන්දීමෙන් ඔබට මෙහි සමහර කාරණා දැනගත නොහැකිය. ඔබට එය ලබා ගැනීමට හැකිවන්නේ ගැලවුම්කරුවාණන්ගේ දෙපාමුල වැටී බලාසිටීමෙන් පමණි. අපගේ ස්වාමීන් වහන්සේ නිශ්ඵලයේ මැරුණේ නැත. උන්වහන්සේ ආත්මයේ දැඩි වේදනාවෙන් යුක්තව නිශ්චලව බලා සිටින සේක.

මාර්ගයේ කෙලවර සිට හෙට දවසේ අපගේ ස්වාමීන් වහන්සේගේ තේජස බලා සිටිමු. පාවුල්තුමා මෙන් අප පසු පසින් තිබෙන දේ අමතක කරමින් ඉදිරියෙ තිබෙන්නාවූ ආශිර්වාදලත් දේ උදෙසා ගමන් කරමු. ඊට බාධා නොවන පිණිස යාච්ඤා කරමු. දෙවියන් වහන්සේ අපව මුදනු ලබා පවිත්‍ර කර, ශුද්ධාත්මයෙන් පූර්ණකරන සේක. එසේ කරන්නේ අපි අපගේම ජීවිත මුදුන්පමුණුවා ගැනීම පිණිස නොවේ.

ශාරීරිකව දිවි පිදීමට නොව ආත්මික තේජසට දෙවියන් වහන්සේ අපව මෙහෙයවන සෙක.
අපගේ කැමැත්ත අතහැර අපි ඇළුම් කරන්නාවූ දේවල් කුරසියේ ඇණ ගැසීමට අපව මෙහෙයවන සේක. එනිසා අපි දෙවියන් වහන්සේගේ තේජස දෙස බලා සිටිද්දී සැගවී තිබෙන්නාවූ දෙවියන් වහන්සේගේ කරුණාව වෙතෙට ළඟා වෙන්නෙමු. ශුද්ධාත්මයාණන් වහන්සේ කරුණුකොටගෙන පමණක් අපගේ සිත් ආලෝක කරමින් එළිදරව් කරන සේක. දවස්පතා දෙවියන් වහන්සේ සමඟ ගමන් කරන්නේ නම් පමණක් මම ප්‍රකාශ කරන්නේ කුමක්දැයි අත්දැකීමෙන් අපට අවබෝධ කර ගැනීමට හැකිවේ. දෙවියන් වහන්සේගේ ශුද්ධාත්මයාණන් වහන්සේ කරුණුකොටගෙන අපි එකිනෙකාව මෙහෙයවන විට අපගේ උද්යෝගය වර්ධනය වී ඉදිරිය සාර්ථක වන්නේය. ස්වාමීන් වහන්සේගේ තේජස මත අපගේ සිත් නැමති ඇස් රැඳී පවතින්නේය.

4 පිටුවෙන්

පිබිදීමේ බලාපොරොත්තුව...

පිඹිදීම උදෙසා යාච්ඤා කරනවිට අපි ඉල්ලා සිටිය යුත්තේ මොනවාද ... ? දෙවියන් වහන්සේගේ සෙනඟ ක්‍රිස්තුස් වහන්සේගේ අභිමුඛත්වයේ නැවුම් ක්‍රියාමාර්ග උපරිමයෙන් අත්දැකීම ආරම්භවීම සඳහා යාච්ඤා කළ යුතුය. අනිත් සියළු ප්‍රතිඵල ඒ තුළින් ගලා එන්නේය. සභාව තුළ සිටින අයගේ ජීවිත වෙනස්වීම සහ සංස්කෘතියේ වෙනස්වීම මනුෂ්‍ය බලපෑමක් කරුණුකොටගෙන ඇතිවන්නේ නැත.නමුත් දෙවියන් වහන්සේගේ සෙකඟගේ ජීවිත තුළින් දෙවියන් වහන්සේගේ බලය ප්‍රකාශ වීමෙන් සියල්ල වෙනස්වීමට ආරම්භ වන්නේය. මෙම යාච්ඤා කිරීම අපගේ ජීවිත වඩා යහපත්ව පැවතීම හෝ බාධා රහිතව ගමන් කිරීම උදෙසා නොවේ. මෙම යාච්ඤා කිරීම දෙවියන් වහන්සේ පිළිබඳව සහ උන්වහන්සේගේ අරමුණ සම්පූර්ණවීම උදෙසාය. මෙම පළමුවන පිඹිදීමේදී නායකත්වය ලබා දුන් "ජෙනතන් එඩවඩ්" ඔහුගේ සබාවේ සෙනඟ ශුද්ධාත්ම ගින්නේ ඇවිලීම කරණුකොටගෙන පිඹිදීම ඇති වූ බව ඒත්තු ගත්තේය. ඇමරිකා එක්සත් ජනපදයේ තුන්වන මහත් පිඹිදීම ඇති වන විට උතුර සහ දකුණු යුද්ධය නිසා ජතිය කොටස්වලට බෙදී පැවතුණි. එම ස්ථානවලින් බොහෝමයක් මත පිඹිදීම ඇති විය.

තවත් මහත් පිඹිදීමක් ඇතිවීමෙන් අපගේ සියළුම අර්බුධවලට පිළිතුර ලැබෙනු ඇතැයි සමහරු බලා සිටින්නෝය. එය ඉතා අනර්ග වන නමුත් එසේ සිදුවීම අපේක්ෂා කළ නොහැකිය. එය සිදුවිය හැකිවන්නේ මහත් දුෂ්කරතාවයන් සහ පීඩා මධ්‍යයේ ය. අපේ ජාතිය පාපයෙන් පිරී සිටීම නිසා සහ එය ව්‍යාපත්ව පැවතීම නිසා දවස්පතා දෙවියන් වහන්සේගේ විනිශ්චය පැමිණ තිබේ. සභාව මුළු ලෝකයටම සුභාරංචිය ප්‍රකාශ කිරීමේ කාර්ය්‍ය සම්පූර්ණ කිරීමට බලය ලබා ගැනීමට හැකි වන පිණිස තවත් මහත් වූ පිඹිදීමක් පැමිණීම ඉතා වැදගත්ව තිබේ. අතීතයේ සිදු වූ සියළු පිඹිදීම්වලදී සුභාරංචියේ බලපෑම ඉතා බලවත්ව පැවතුණි. නැවතවාරයක් එලෙස සිදුවේ යැයි මම විශ්වාස කරමි. ක්‍රිස්තුස් වහන්සේගේ ශරීරය වන සභාව ස්වර්ගීය මනමාලයා වන යේසුස් වහන්සේගේ මනමාලිය ලෙස සූදානම්වීම සඳහා පසුතැවිලිවීම සහ යටහත්කම තුළ පැවතීමත් එකතු කරගත යුතුය. පිඹිදීම තුළ දී සභාවට අළුත් ගිවිසුමේ සඳහන් පවිත්‍රකම, යුද්ධකම, දැඩි උද්යෝගය නැවත පිළියෙල කරගත හැකිය.

පිඹිදීම වෙනුවෙන් යාච්ඤා කරන්නේ කෙසේද කියා ගීතාවලියේ 85 වන ගීතිකාවේ පැහැදිලි පින්තූරයක් අපට ලබා දී තිබෙන අතර අපගේ යාච්ඤාවලදී එය භාවිතා කරමු. ***"අපේ ගැලවීමේ දෙවියන් වහන්ස අප හැරෙව්ව මැනව. අප කෙරෙහි වූ ඔබගේ කෝපය නැවැත්වුව මැනව. ඔබ අප සමඟ සදාකල්ම උදහස්වන සේක්ද, .. ? සියළු පරම්පරාවලට ඔබගේ උදහස පවත්වන සේක්ද, .. ? ඔබගේ සෙනඟ ඔබ කෙරෙහි ප්‍රීතිමත් වන පිණිස අප නැවත ජීවත් නොකරන සේක්ද, .. ? ස්වාමීනී ... ඔබගේ කරුණාව අපට දැක්වුව මැනව. ඔබගේ ගැලවීම අපට දුන මැනව"*** (ගීතාවලිය 85: 4-7)

යෙසායා 63: සහ 64: පරිච්ඡේද පිඹිදීම උදෙසා යාච්ඤා කිරීම පිළිබඳව මාගේ සිත ආකර්ෂණය කරගත්තාවූ තවත් බයිබල් කොටසකි. එහිදී ඊශ්‍රායෙල් සෙනඟ දෙවියන් වහන්සේගේ අභිමුඛත්වය අහිමි කරගැනීම ගැන දීර්ඝ ලෙස කථා කරමින් අවබෝධ කරදෙනු ලබයි. අතීත දවස්වලදී දෙවියන් වහන්සේට මොරගසන්නේ නැතිව සිටි ස්වභාවයෙන් උන්වහන්සේ වෙතට හැරී එන ලෙස ඔවුන්ට මතක් කර දෙන සේක. පරණ ගිවිසුමේ මෙම බයිබල් ඡේදයන් අළුත් ගිවිසුමට රැගෙන ඒමේ සත්‍යතාවය අවබෝධ කරගෙන පිඹිදීම උදෙසා බලයෙන් පූර්ණව යාච්ඤා කිරීමෙහි යෙදී සිටිමු. යෙසායා අනාගතවකතෘ මෙන් ඔබගේ ජීවිතය යාච්ඤාවෙහි යොදවනවාදැයි කල්පනා කර බලන්න. ***"අහෝ .., ඔබගේ එදිකාරයන්ට ඔබගේ නාමය දන්වන පිණිසද, ඔහු ඉදිරියෙහි ජාතීන් වෙවුලවන පිණිසද, ඔබවහන්සේ අභය පලාගෙන බසින්ටත්, ගින්න කැලෑව දල්වන්නාක් මෙන් ද, ගින්න වතුර උතුරවන්නාක් මෙන්ද, ඔබ ඉදිරියෙන් කඳු දියවයන්නටත් යෙදුනොත් හොඳය."*** (යෙසායා 64:1-2)

වැදගත් දැන්වීමක්...

පෙරමග දූතයා පත්තරයට කිසිදු විදිහක අයකිරීමක් නොකරන අතර එය නොමිලේ බෙදාහැරේ. දායක මුදලක් මේ පත්‍රයට අය නොකරන නමුත් මෙහි වියදම් සඳහා කිසියම් මුදලක් දීමට පෙළඹීමක් ඇත්නම් එය කෙලින්ම සංස්කාරකට පමණක් එවන්න.

මුලසිට අග දක්වා නිවැරදි දේව වචනය අඩංගු බයිබලය පැහැදිලි කරමින් ක්‍රිස්තුස් වහන්සේ දෙවන පැමිණීමට සෙනඟක් සුදානම් කිරීම පෙරමග දූතයා පත්‍රයෙහි මූලික පරමාර්ථය බැවින් අන්තර් ආගමික හෝ අන්තර් නිකායික වාදවිවාද වලට මෙහි ඉඩ සලසා දෙන්නේ නැත. එහෙත් ඔබගේ ආත්මික ජීවිතයේ යම්කිසි ගැටළුවක් පැන නැඟී නම් දේව වචනය අනුව එය විසඳා ගැනීමට අපට ලියා එවන්න. පෙරමග දූතයා පත්‍රයෙන් ඔබට ලැබෙන්නා වූ ආශිර්වාදයන් ලියා එවීම අපට සතුටක් වන අතර දෙවියන් වහන්සේට මහිමය ගෙන දෙන්නකි.

අපගේ උත්සාහය යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ සාක්ෂිකරුවන් හැටියට සේවය කිරීමයි. එබැවින් අපට නිකායක් නැත. කිසිම චේතනයක් හෝ වැටුපක් නොලබන අපි මෙම සේවයේ දියුණුව උදෙසා උනන්දුකමින් යාච්ඤා කරන මෙන් ඔබගෙන් ඉල්ලා සිටිමු.

ඔබගේ සියළුම ලිපි, ආධාර මුදල් (චෙක්පත් හෝ මුදල් ඇණවුම්) යාච්ඤා ඉල්ලීම්. සාක්ෂි සහ ඔබගේ ගැටළු මෙසේ එවන්න.

සංස්කාරක:
පෙරමග දූතයා
30/7, චාල්ස් පෙදෙස, රාවතාවත්ත,
මොරටුව

මොරටුව රාවතාවත්තේ පදිංචි ගරු දේවගැති වීරප්පුලිගේ නිස්සංක වෙනුවෙන් කොළඹ 10, ජයන්ත වීරසේකර මාවතේ අංක 47 දරන ස්ථානයේපිහිටි ස්ටාර් මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.